# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,845 — 1969 මාර්තු 14 වැනි සිකුරාදා — 1969.3.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 387 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 403 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 405 | රට බීම ටිකිණිංම් බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 432 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 432 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්‍ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්ව යක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්‍ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

**සංලක්‍ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

**5. අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්‍ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රැජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය හිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දැතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරනලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතු වෙන්ම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංක ඒ. 89/එක්ස්. 2029/68

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### මහා විද්‍යාලයන්හි I ශ්‍රේණියේ විශේෂ තනතුරු

රජයේ සිංහල දෙමළ සහ මුස්ලිම් මහා විද්‍යාලයන්හි I ශ්‍රේණියේ විශේෂ තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1969 මාර්තු මස 28 වැනිදා.

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1969 අප්‍රේල් මස 3 වැනිදා.

**සැලකිය යුතුයි :**

1968.12.6 දින හා අංක 14,831 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ම විසින් පල කරන ලද නිවේදනය අනුව හා 1969.1.24 දින අංක 14,838 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ම විසින් පළ කරන ලද සංශෝධිත ගැසට් නිවේදනය අනුව **මෙම තනතුරු සඳහා දැනටමත් ඉල්ලුම්පත් එවා ඇති අය නැවත ඉල්ලුම්පත්‍ර එවීම අනවශ්‍ය ය.**

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරි යෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින්, 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නො ගැසුවාවූ ද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) මුද්‍රිත අයදුම්පත්‍රයේ 15 වැනි කොටුවේ , තමා ඉල්ලුම් කරන්නේ, සිංහල, දෙමළ, මුස්ලිම් මහා විද්‍යාලයක විශේෂ තනතුරක් සඳහා දැයි සඳහන් කළ යුතුයි.

(iv) පිටරටවල අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැන වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(v) **වෛද්‍ය පරීක්‍ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්‍ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්‍ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත් කරනු ලැබුවකු තෝරා ගැනීමට පෙර, විශ්‍රාම වැටුප් වාර්තා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරයෙකු/වරියක වශයෙන් තනතුරක් දැරුවේ නම්, ඔහු/ඇය විසින් මෙම තනතුර දරණ තෙක් විශ්‍රාම වැටුප් වාර්තා යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුද්දක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව, අළුත් තනතුරට පත් කරනු ලැබේ. තනතුර ස්ථිර කිරීමෙන් පසු, මුදල් රෙගුලාසි අනුව, ශ්‍රේණියට උසස් කල දින සිට නියමිත වැටුප් ක්‍රමයේ ඔවුන් පිහිටුවනු ලැබේ.

(iii) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිසත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිසත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලටද, අනුකූලව තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් ක්‍රියා කළ යුතුවේ.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්ට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සිදුවනු ඇත.

(v) සෑම අයදුම්කරුවකුම විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

3. **වැටුප් හා දීමනා.**—මේ තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය :—

වර්ෂයකට රුපියල් 5,160—360—8,400

4. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) මෙරට අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (69.3.28) අයදුම්කරුගේ වයස අවුරුදු 30 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (උපරිම වයස් සීමාව දැනට රජයේ සේවයේ නියුතු අයවලුන්ට බලපානු නො ලැබේ.

(ii) යටත් පිරිසෙයින් අවුරුදු 5 ක සේවයක් ඇති පුහුණු උපාධිධරයෙකු, හෝ සමාන සහතික දරන්නෙකු, හෝ

(iii) උපාධිය ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක I වෙනි පෙළ හෝ II වැනි පෙළ ගෞරව උපාධියක් ලත් උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නෙකු, හෝ

(iv) උපාධිය ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 7 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නෙකු, හෝ

(v) යටත් පිරිසෙයින් අවුරුදු 10 ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු හෝ සමාන සහතික දරන්නෙකු, හෝ

(vi) II වැනි ශ්‍රේණියේ විශේෂ තනතුරු ධාරියෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක සේවයක් ඇති II වැනි ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරියෙකු හෝ විය යුතුය.

**1 වැනි සටහන :** අයදුම්කරුවන්ට, සිංහල/දෙමළ පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්, අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යයෙන් සාමාර්ථයක් හෝ ඊට සමාන වූ හෝ ඊට වඩා උසස් හෝ සාමාර්ථයක් කලින් ලබා නැතිනම්, පත්වීමේ දින සිට අවුරුදු 3 ක කාල සීමාවක් ඇතුළත අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගයේ සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යයෙන් ඔවුන් විසින් සාමාර්ථය ලබා ගත යුතුය. සිංහල/දෙමළ සාමාර්ථය ලබා ගැනීම සඳහා අවුරුදු 3 කට වැඩියෙන් ගතවන කාලය, වැටුප් වැඩිවීම පමා කළ කාල සීමාවක් සේ සලකනු ලැබේ.

**2 වැනි සටහන :** මෙහි සඳහන් පුහුණු උපාධිධාරියෙකු/උපාධිධරයකු/ද්විතීය පුහුණු ගුරුවරයෙකු/සිංහල, දෙමළ පුහුණු ගුරුවරයෙකු වශයෙන් සේවා කාල ගණන් ගැනීමේදී අධ්‍යයන නිවාඩු හා වැටුප් රහිත නිවාඩු කාල ගණන් ගනු නො ලැබේ.

**3 වැනි සටහන :** තෝරාගනු ලබන විශේෂ තනතුරුධාරීන් සාමාන්‍යයෙන් මහාවිද්‍යාලවල නියෝජ්‍ය විදුහල්පතීන් වශයෙන් හා අංශ භාර ප්‍රධානීන් වශයෙන් පත්කර යවනු ලැබේ. අංශ භාර ප්‍රධානීන් වශයෙන් පත් කරනු ලබන විශේෂ තනතුරුධාරීන් පහත සඳහන් විෂය ක්ෂෙත්‍රයන්ද භාරව කටයුතු කරනවා ඇත.

(i) භාෂාව හා ආගම.

(ii) ගණිතය හා විද්‍යාව.

(iii) සමාජ විද්‍යා විෂයයන් (ඉතිහාසය, භූගෝල විද්‍යාව, ආණ්ඩු ක්‍රම, අර්ථ ශාස්ත්‍රය, ප්‍රජාචාරය ආදිය.)

(iv) කාර්මික, වාණිජ හා රසඥත විෂයයන්

5. පහත සඳහන් ලිය කියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික භාරගනු නො ලැබේ.

(බී) උපාධි හෝ උසස් අධ්‍යාපනික සහතික.

(සී) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඩී) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. :

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදුවුවත් තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගැනීමට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර, මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පෞද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කායර්ාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුයි. මේ විධානය ඉටු කිරීම හැහැර හැරියොත් අයදුම්කරුවකු ගැන සළකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

3–594/1—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

අංක. ඒඒ. 34/එක්ස්. 2066/68

## කොළඹ වරාය කොමිෂම

### නියෝජ්‍ය මාස්ටර් ඇටන්ඩන්ට් තනතුර

කොළඹ වරාය කොමිෂමේ නියෝජ්‍ය මාස්ටර් ඇටන්ඩන්ට් තනතුර සඳහා අයදුම්පත් එවන්නැයි ලාංකිකයන් වෙත මින් ආරාධනය කෙරේ. මෙම කාර්යාලයයෙන් සැපයෙන ආකෘතිපත්‍රවල සකස් කරුණු අයදුම්පත් කොළඹ 1, අංක 500 දරණ තැපැල් පෙට්ටිය පැවරුණු රාජ්‍ය සේවා කොමිෂමේ ලේකම් වෙත පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ එවිය යුතුය.

මෙරට අයදුම්පත්.—1969 මාර්තු මස 28 වැනිද.

විදේශීය අයදුම්පත්.—1969 අප්‍රේල් මස 3 වැනිද.

**සටහන—**

(1) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුයි.

(2) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු දෙකක ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ.

**3. වැටුප් සහ දීමනා :**

මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ ය—රු. 13,800—600—රු. 15,600.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයැදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) තමා විශිෂ්ඨ චරිතයෙන් හා යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) තමාගේ වයස 69.3.28 දිනට අවුරුදු 35ට නොඅඩු බව හා අවුරුදු 45 ට නොවැඩි බව. (රජයේ සේවයෙහි දැනට නිරත නිලධාරීන් කෙරෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) (1) එංගලන්තයේ වෙළඳ මණ්ඩලය මගින් නිකුත් කැරුණු ශ්‍රේෂ්ඨ නාවිකයන්ගේ ප්‍රවීණතා සහතිකය තමා දරන බව.

(2) මුහුදු කටයුතු සමීක්ෂණය පිළිබඳව යහපත් ප්‍රායෝගික දැනීමක් තමා දරන බව.

(3) වෙළඳ නැව්තොටක එසේ නැතහොත් නාවික හමුදා නැව් තොටක වගකිවයුතු තත්ත්වයක් දරමින් යටත් පිරිසෙයින් අවුරුදු 8 ක වත් පාලන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තමා දරන බව.

(4) ප්‍රදීපාගාර උපකරණ හා කටයුතු පිළිබඳව ප්‍රායෝගිකව දැනීමක් තමා දරන බව.

(5) තම දෘෂ්ටිය හා ශ්‍රවණය යහපත් බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නො ලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(එ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

**සැලකිය යුතුයි :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ('ආ' සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සමග භාවිතා කල හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝමර්ය සමග තමන් වෙත නිකුත් කරන ලද ('අ' සලකුන දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිලිපදින්නාවූද, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලබන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 1, තැ. පෙ. 500, ගාලුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

3–594/2—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## තක්සේරු දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ තක්සේරු පරීක්ෂක තනතුරු

තක්සේරු දෙපාර්තමේන්තුවේ II වෙනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් අයදුම් පත්, ඉල්ලුම්කරුගේම අත් අකුරින් පුරවා කොළඹ 7, අංක 5 සහ 7 ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙසේ ප්‍රධාන තක්සේරුකරු වෙත 1969.3.29 දිනට හෝ ඊට පෙර හෝ ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුයි.**—ඉල්ලුම් පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "II වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්" යන්න සඳහන් කළ යුතුයි.

2. **වැටුප.**—මෙම තනතුරට අදාල වාර්ෂික වැටුප රු. 1,860 න් ආරම්භවී 120 බැගින් රුපියල් 3,780 ට නගී. වාර්ෂික වැටුප රු. 2,820 ට නැගීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් පසු කළ යුතුයි.

තෝරාගත් අයැදුම්කරුවන් කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා උසස් කිරීමට පෙර නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතුය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුරු සථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වනවා ඇත. ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කළයුතුවාක් මෙන්ම, අවශ්‍ය සියළු රාජකාරි ගමන් ද කළ යුතුයි. මුදල් රෙගුලාසි අනුව ගමන් වියදම් ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) සෑම අයදුම්කරුවෙක්ම 1969 මාර්තු 29 වැනි දිනට අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි බව සනාථ කිරීමට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(ii) අයදුම්කරුවෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඊට සමාන හෝ ඊට උසස් අන් විභාගයකදී ගණිතය (අංක ගණිතය නොවේ) විෂයයක් ලෙස ඇතිව සාමාර්ථය ලබා සිටිය යුතුයි. දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී නොසිටින අය විසින් ඉහත සඳහන් සුදුසුකමට අමතරව පහත සඳහන් සුදුසුකම් වලින් එකක්ද ලබා සිටිය යුතුයි :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය හෝ

(ආ) ලංකා කෘෂිකාර්මික පාසැලේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ

(ඇ) බිම් මැනීම සහ මට්ටම් කිරීම පිළිබඳව සර්වෙයර් ජනරාල්ගේ බලපත්‍රය හෝ

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරු පිළිබඳ ඩිප්ලෝමා පාඩම් මාලාව අවුරුදු දෙකක් සතුටුදායක ලෙස අවසන් කර තිබීම.

5. අයදුම්කරුවෝ අයදුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුයි :—

(අ) ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ආ) සුදුසුකම්, චරිතය සහ පත්වීම ලැබීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව මෑතකදී ලබා ඇති සහතික තුනක්, සහ

(ඇ) උප්පැන්න සහතිකය හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකය (ඒවා තිබේ නම්).

සැ. යු. (i) පසු යම් දිනක උප්පැන්න සහතිකය හෝ වයස පිළිබඳ විශේෂ සහතිකය හෝ ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට දැන්වූ විට, ඔවුන් ඒවා ඉදිරිපත් කළ යුතුය.

(ii) පොදු සහතික පත් (උසස් පෙළ) පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන්, ඔවුන් උපාධි පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය අවම සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි ලියකියවිලි මගින් ඉදිරිපත් කළ යුතුය.

6. දැනට රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන්ගේ අයදුම් පත් 109 වැනි පාලන රෙගුලාසිය අනුව, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනය ඉකුත්වී, මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම් පත්, නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ලැබී, ප්‍රමාදය පිළිබඳව පිළිගත හැකි හේතු දක්වා පිළිගත යුතු යයි එකී දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කළහොත් මිසක, භාර ගනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුළ පලවන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ කොන්දේසි බලනු මැනවි.

ඩී. පී. පී. අභයගුණවර්ධන,
ප්‍රධාන තක්සේරුකරු,

තක්සේරු දෙපාර්තමේන්තුව,
අංක 5 හා 7, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස,
කොළඹ 7. 1969. 2. 28.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**තක්සේරු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ පරීක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රයයි**

1. සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. (අ) වයස : ————.
   (ආ) උපන් දිනය :————.
4. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
5. ලාංකිකත්වය පරම්පරාවෙන් ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.
6. විවාහකද, අවිවාහකද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් සහ අවසානයට සමර්ථවූ විභාගය විෂය යන් සමග :————.
8. ජාතික භාෂාවෙන් කියවීමට සහ ලිවීමට ඇති හැකියාව :————.
9. අධ්‍යාපනය ලැබූ පාඨශාලා සහ විද්‍යාල, ඒවාට ඇතුලත්වූ සහ අස්වූ දිනයන්, සමර්ථවූ විභාග සහ විෂයයන්, සමර්ථ වූ දිනයන්, ලබාගන්නා ලද තෑගි, ශිෂ්‍යත්ව සහ දීමනා :————.
10. පාසැලේ හෝ විද්‍යාලයේදී කළ ක්‍රීඩා සහ විෂය මාලාවෙන් බාහිරව කළ කටයුතු ගැන විස්තර :————.
11. පාසැලෙන් අස්වූ දින සිට කළ රැකියාවන් ගැන සම්පූර්ණ විස්තර සහ වකවානු :————.
12. වෙනත් විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර (උදා: වෘත්තීය, කාර්මික යනාදි) :————.
13. චරිත සහතික ලැබී තිබෙන අයගේ නම් සහ නිලතල :————.
    (පිටපත් පමණක් ඉදිරිපත් කරන්න)
14. තිබේ නම්, යුද සේවය පිළිබඳ තොරතුරු :————.
15. ණයවීම් හෝ වෙනත් මුදල් පිළිබඳ කරදර වලින් නිදහස් ද යන වග :————.
16. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයදුම් පතෙහි සඳහන් කර ඇති විස්තර සැබෑ බවද නිවැරදි බවද මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති විස්තර යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ දැනගන්නට ලැබුණොත් මා පත්වීම ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවද පත්වීමට පසු දැනගන්නට ලැබුනොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහකරනු ලබන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–306—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

**ගුවන් ගමනාගමන පාලක (II ශ්‍රේණිය) තනතුර**

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් ගමනාගමන පාලක (II ශ්‍රේණිය) තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා එවන අයදුම් පත් පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කොට, 1969.3.29 වැනිදට හෝ ඊට පෙර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, තැ. පෙ. 535, ලෝටස් පාර, කොළඹ 1 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 3,180 න් පටන් ගෙන, රු. 120 බැගින් වන වාර්ෂික වර්ධකයන් 6 කින් සහ රු. 180 බැගින් වන වාර්ෂික වර්ධකයන් 8කින් වර්ෂයකට රු. 5,340 දක්වා වැඩි වන්නකි.

3. **වයස් සීමාව.**—1969.3.29 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත වූවනට ඉහත වයස් සීමාව බල නො පානු ඇත.

4. **අයදුම්කරුවනට තිබිය යුතු අධ්‍යාපනික හා සෙසු සුදුසුකම්.**—

(අ) (i) අපහසුවකින් තොරව ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමේ හැකියාවකුත් ඇතිව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථ්‍යයන් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය

හෝ

(ii) අපහසුවෙන් තොරව ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමේ හැකියාවකුත් ඇතිව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථ්‍යයනුත් වෙනත් විෂයයන් 3 කින් සාමාර්ථයනුත් සහිත අධ්‍යාපන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ).

හෝ

ඊට සමාන හෝ උසස් ශාස්ත්‍රීය සුදුසුකම්

සහ

(ආ) (i) වාණිජ නියමු බලපත්‍රයක්

හෝ

(ii) ගුවන් යාන්ත්‍රිකයකු වශයෙන් පැය 500 කට නොඅඩු ගුවන් පළපුරුද්දක් සහිතව ගුවන් යාන්ත්‍රික බල පත්‍රයක්.

හෝ

(iii) පිළිගත් ආයතනයකින් ලබාගත් ගුවන් ගමනාගමන පාලනය පිළිබඳ ප්‍රවීණතා සහතික පත්‍රයක්.

(ඇ) ඉහත 4 (ආ) ඡේදයෙහි නියමිත සුදුසුකම් නොමැති වියහැකි වුවද, භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතිව, පිළිගත් විශ්ව විද්‍යාලයක බී.ඇස්.සී. උපාධියක් ලබා ඇති අයදුම්කරුවෝද මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ වෙති.

5. **සේවයෙහි යෙදවීමේ වගන්ති.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

6. පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අයදුම් පතට ඇමිණිය යුතුය. මෙම පිටපත් අයදුම්කරුවනට ආපසු එවනු නොලැබේ. සියලුම සහතික පත් හා ලියවිලිවල මුල් පිටපත් අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. මෙම සහතික පත්‍ර හෝ ලියවිලි කිසිවක් ඉදිරිපත් නොකිරීම අයදුම් කරු නුසුදුස්සෙකු බවට පත් කිරීමට හේතු වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා වන නියෝග සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාර ගනු නොලැබේ).

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) කලින් පළපුරුද්ද/කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවාවේ තනතුරු වලට කෙරෙන පත් කිරීම් පිළිබඳව පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම් පත් හෝ මේ තනතුරට අදාල වන අනෙකුත් ලියවිලි සියල්ලක්ම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.

## අයදුම් පතෙහි ආකෘතිය

**ගුවන් ගමනාගමන පාලක (II ශ්‍රේණිය) තනතුර**

1. සම්පූර්ණ නම :————.
2. තැපැල් ලිපිනය :————.
3. උපන් දිනය හා වයස :————.
4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ—
   (i) පරම්පරාවෙන් ද ? නැතහොත්
   (ii) ලියා පදිංචිවීමෙන් ද ? :————.
5. සමත් වූ උසස්ම විභාගය :————.
   (විෂයයන් සඳහන් කළ යුතුයි).
6. සමත් වූ කාර්මික විභාගය :————.
7. පළපුරුද්ද :————
8. විශේෂ සුදුසුකම් හා හිමිකම් :————.
9. දැනට කරන/කලින් කළ රක්ෂාවල් පිළිබඳ විස්තර :————.

මේ අයදුම් පතෙහි ම විසින් සපයනු ලැබ ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි විස්තර කිසිවක් අසත්‍ය බවට හෝ වැරදි බවට ඔප්පු වුවහොත් මේ පදවියට මා පත් වීමට නුසුදුසු වන බව හා පත්වීමෙන් පසුව අසත්‍යතාවයක් ඔප්පු වුව හොත් කිසිම වන්දියකට මා අහිමි වී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–311—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

ප/7/66/100.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වැඩ පරීක්ෂක තනතුර

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප.**—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය මෙසේය: වර්ෂයකට රුපියල් 1,860—120—රු. 3,780 (කාර්යක්ෂමතා කඩඉම රුපියල් 2,820 ට පෙර) රුපියල් 3,900—180—රු. 5,340.

3. **සේවා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය; විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු තුනක ආධුනික කාල සීමාවකට යටත් වේ.

(ii) තෝරාගත් අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවයෙහි නියුක්ත විය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානයා නියම කරන ආකාරයකට මුදලින් ඇප තැබීමට ද යටත් විය හැකිය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(අ) 1969.3.1 දිනට වයස අවුරුදු 25 කට අඩු නොවිය යුතු අතර අවුරුදු 35 කට වැඩි නොවිය යුතු බවට (රාජ්‍ය සේවාවේ නියුක්ත නිලධාරීන් කෙරෙහි මෙම උපරිම වයස සීමාව අදාල නොවේ);

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට;

(ඇ) අවුරුදු 5 ක සිවිල් ඉංජිනේරු ආධුනිකත්වය සම්පූර්ණ කර තිබෙන අතර IV (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත්ව සිටින බවට; හෝ

(ii) සැලසුම්කරුවෙකු හෝ ඕවර්සියර් කෙනෙකු වශයෙන් අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති අතර IV (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සමත්ව සිටින බවට; හෝ

(iii) කාර්මික විද්‍යාලයේ අවුරුදු 4 කට නොඅඩු සිවිල් ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති බවට; හෝ

(iv) මිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ සර්වේ ජනරාල්ගේ බලපත්‍රය ලබා සිටින අතර ජල සැපයීම, ගොඩනැගිලි ගොඩනැංවීම් වැනි ගොඩනැගිලි වැඩ පිළිබඳ දැවුරුද්දක පළපුරුද්දක් ඇති බවට; හෝ

(v) සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු ආධුනිකත්වය සම්පූර්ණකොට තිබෙන අතර පස් අවුරුද්දකට නොඅඩු (එකතු වූ විට) ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට. මීට අමතර වශයෙන් මෙම කරුණු ද්වයෙහි ලා ඉදිකිරීම් හෝ විශාල ගොඩනැගිලි. වැඩ සහ මිණුම් මට්ටම් කිරීම පිළිබඳ න්‍යායානුකූල දැනීමක් හා ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට;

**සැ. යු.**—(මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු විය හැකි අතර පත්වීම ලැබ අවුරුදු දෙකක් තුළදී IV (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපතීමේන්තුවේ උප පරික්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ විභාගයෙන්ද සමත්විය යුතුය); හෝ

(vi) යටත් පිරිසෙයින් කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටින අතර පාරවල් තැනීම හා ගොඩනැගිලි වැඩ පිළිබඳ හෝ ජල සැපයීම පිළිබඳව අඩුතම වශයෙන් 7 අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති බවට. මිණුම් හා මට්ටම් කිරීම පිළිබඳ මනා දැනීමක් ද තිබිය යුතුය.

**සැ. යු.**—(මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයින්හට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවිය හැකි අතර පත්වීම ලැබ අවුරුදු දෙකක් තුළදී IV (අ) පරිශිෂ්ටයෙහි නියමිත ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීමේ විභාගයෙන් ද සමත්විය යුතුය.)

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය:—

(i) උප්පැන්න සහතිකය.

(ii) උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික තුනක්.

(iv) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික.

6. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුරූප වන සේ පිළියෙල කළ අයදුම් පත් 1969 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙණියේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) ට ලැබෙන සේ එවිය යුතුය. එම අයදුම් පත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) ගේ නමින් අමතා ඉදිරිපත් නොකළ යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙහිලා අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ලො. බ. මාරඹේ,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන).

1969 මාර්තු මස 3 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

### වැඩ පරීක්ෂක තනතුර සඳහා ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. උපන් දිනය :————.
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය හා දිනය :————.
6. උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.
7. කාර්මික සුදුසුකම් :————.
8. පළපුරුද්ද :————.
9. අමුණා ඇති චරිත සහතික පත්‍ර නිකුත් කළ තිදෙනෙකුගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–460—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ ගනේගොඩ කොට්ඨාශයේ උප්පැන්න, හා මරණ සහ කුරුවිටි කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ත්‍රාර් ධුරය

ගනේගොඩ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කායර්‍යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායර්‍යාල, ග්‍රාම සේවක කායර්‍යාල, පළාත් පාලන ආයතන සහ කායර්‍යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායර්‍යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායර්‍යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත්වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායර්‍යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අප්‍රේල් 15 වැනි දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සී. සී. ටී. පොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1969 මාර්තු 1 වැනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර් කායර්‍යාලයේ දිය.

3–483—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

සාප/5/137

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### II වැනි පන්තියේ ජලනල කාර්මික තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ II වැනි පන්තියේ ජලනල කාර්මික තනතුරක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1969 මාර්තු මස 30 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුයි :—

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(i) තනතුර ස්ථිරය. පත්කරනු ලබන්නාගෙ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964.2.7 දින හා අංක. 633 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට යටත් වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි පිහිටුවීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අර මුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කරනු ලබන්නා රාජ්‍ය භාෂා පණතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් :—

(අ) පරීක්ෂණ කාල සීමාව අවුරුදු 3 ක් විය යුතුයි.

(ආ) ඔහු රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ භාෂා පණතේ විධිවිධානයන් ක්‍රියාවට නැඟීම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින්මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත සේවය කළ යුතුවේ.

(iv) පත්කරගනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි සහ කලින් කල රජය විසින් නිකුත් කෙරෙන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත් වනු ඇත.

(vi) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය මෙසේ ය.

(අ) කොළඹ හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා—ප්‍රථම හය මාසය තුළ දිනකට රුපියල් 2.30 බැගින්, ඉන්පසු වර්ෂයකට රුපියල් 750—42—1,296.

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළි නොගත් ආයතනවල සේවය කරන්නවුන් සඳහා—ප්‍රථම හය මාසය තුළ දිනකට රුපියල් 2.10 බැගින්, ඉන්පසු වර්ෂයකට රුපියල් 750—42—1,086.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) සෑම අයදුම්කරුවෙක්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක සේවය කරන්නෙකු විය යුතුයි.

(ආ) යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුයි.

(ඈ) (i) කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

(ii) 1/32" පරිමාණයක් කියවිය හැකිවිය යුතුය.

(iii) වෘත්තියට අවශ්‍ය උපකරණවල නම්, පාවිච්චිය හා ඒවායේ නඩත්තුව පිළිබඳ දැනුමක් තිබිය යුතුයි.

(iv) තමාට පැවරෙන රාජකාරි කටයුතු ගැන මනා දැනුමක් තිබිය යුතුයි.

(v) සරල ඇඳීම් කියවා තේරුම් ගත හැකිව තිබිය යුතුය.

(ඉ) ඉහත (අ), (ආ), (ඇ), (ඈ) හි සඳහන් සුදුසුකම්වලට අතිරේකව පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි. මෙම සුදුසුකම් දක්වා ඇත්තේ වැඩි සැලකිල්ලක් ලබන අනු පිළිවෙලිනි :—

(i) III වැනි පන්තියේ අඩුම වශයෙන් අවුරුදු 3 ක සේවයක් සහිතව කම්කරු ශ්‍රේණියේ III හා IV වැනි පන්තිවල අඩුම වශයෙන් අවුරුදු 5 ක සේවයක් තිබිය යුතුයි.

නැතහොත්

(ii) IV වැනි පන්තියේ පූර්ව සේවයක් සහිත II වැනි පන්තියේ අවුරුදු 3කට අඩු සේවයක් ඇත්තාවූ ද එහෙත් III වැනි පන්තියේ අවුරුද්දක සේවය IV වැනි පන්තියේ අවුරුදු 2 ක සේවය මෙන් ගණන් ගැනීමෙන් III වැනි හා IV වැනි පන්තිවල අවුරුදු 8 ක මුළු සේවයක් තිබිය යුතුයි.

නැතහොත්

(iii) පිළිගත් ආයතනයක (අ) II වැනි පන්තියේ වෘතිකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් 3 අවුරුද්දක සේවයක් හෝ (ආ) III වැනි පන්තියේ වෘතිකයෙකු වශයෙන් අවුරුදු 6 ක සේවයක් හෝ ඇත්තාවූද, III වැනි පන්තියේ අඩුම වශයෙන් අවුරුදු 2 ක සේවයක් තිබිය යුතුයි.

නැතහොත්

(iv) IV වැනි පන්තියේ අවුරුදු 8කට නොඅඩු සේවයක් තිබිය යුතුය.

නැතහොත්

(v) පිළිගත් ආයතනයක පයිප්පකරු තනතුරක අවුරුදු 5 කට නොඅඩු පූර්ව සේවයක් සහිත දෙපාර්තමේන්තුවේ III හෝ IV වැනි පන්තියේ සේවකයෙක් විය යුතුය. (මෙම ගණයේ සේවකයින් සලකා බලන ලබන්නේ ඉහත (I), (II), (III) සහ (V) ගණයට අයත් සේවකයින් නොමැති අවස්ථාවලදීය. තවද, පූර්ව සේවය සහතික පත් මගින් සනාථ කළ යුතුය.)

සටහන.—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තියෙකු ලෙස සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) 4 වන ඡේදයේ (ඉ) අනුඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්ව සේවය පිළිබඳ සහතික.

(ඈ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත් වූ ඉහළම විභාගය දැක්වෙන සහතිකය.

සටහන.—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් බාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසිද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුනු බව දන්වනු ලැබේ. ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණ බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 5 දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදීය.

### ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම්පත් බාරගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගෙන් පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියා පදිංචි කිරීමෙන් ද යන වග :————.
7. අධ්‍යාපන සුදුසුකම් :
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඉ) අනු ඡේදය යටතේ සේවා විස්තර :————.
   (සේවය කළ ආයතනය, සේවා කාලයන්, දැරූ තනතුර සඳහන් කළ යුතුයි).
9. විවාහකද? අවිවාහකද? වැන්දඹුද?————.
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් :
    (අ) දිනය :————.
    (ආ) නඩු නොම්මරය :————.
    (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත භටයෙක් වී නම් :
    (අ) සේනාංකය :————.
    (ආ) නිලය :————.
    (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :
    (i) දරන ලද තනතුර :————.
    (ii) නියුක්තව සිටි වකවානුව :————.
    (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :
    (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව : ආයතනය :————.
    (i) තනතුර හා ශ්‍රේණිය :————.
    (ii) ඊට පත්වූ දිනය :————.
    (iii) විශ්‍රාම වැටුප් සහිතද? තාවකාලික හෝ අනියම්ද? :————.
    (iv) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
    (v) මී ලඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
17. වෙනත් කරුණු :————.
18. මේ අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් හා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුව හොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය ————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/137

අධ්‍යා. සං./ලේ.

මෙම අයදුම්පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ........................අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව් *මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

......................
......................

......................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :...............

දිනය :————.

(*අදාල නැති කොටස් කපා හරින්න).

3–552—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ ආධුනික සැලසුම්කරු තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ ආධුනික සැලසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙම කායඹාලය මගින් ඉල්ලුම් පත් සපයනු නොලැබේ. නමුත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම් පත් 1969.4.1 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන්නට එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය රු 960—72—රු. 1,104 වේ.

සටහන.—4(ii) (අ) හා 4(ii) (ආ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඇති සේවකයින් ඉහත දැක්වුණු වැටුප් ක්‍රමය මත පිළිවෙලින් වර්ෂයකට රු. 1,032 හා රු. 1,104 ආරම්භක වැටුප් ලැබීමට සුදුස්සෝ වෙත්.

3. වයස් සීමාව.—අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට අඩු නොවිය යුතු අතර 30ට වැඩි නොවිය යුතුය.

4. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :

(i) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යාපනික සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙලෙන් සාමාර්ථ්‍ය සහ පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් තිබිය යුතුය.

(ii) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ එක් අවුරුදු පූර්ණ කාල දිවා පාඨමාලාවක් (සැලසුම්කරු පාඨ මාලාව) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි පාඨ මාලාව (දෑවුරුදු) සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම, හෝ

(ඇ) ගොඩනැගිලි නිර්මාණය කිරීම සඳහා වූ සන්ධ්‍යා හෝ අර්ධ කාලීන පාඨමාලාවේ I, II සහ III වෙනි කොටස් සාර්ථක ලෙස අවසන් කිරීම.

5. සේවයට බඳවා ගන්නා ක්‍රමය.—මේ කාර්ය සඳහා ස්ථාපිත තේරීම් මණ්ඩලයක් විසින් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කරනු ලැබේ.

6. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) ඉල්ලුම් පත්‍රවලට ඉල්ලුම්කරුවන් විසින් ඈමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) චරිත සහතික තුනක්, මින් එකක් අයදුම්කරු අන්තිමට ගිය පාසැලේ ප්‍රධානියාගෙන් ලබාගත් එකක් විය යුතුය.

(ඇ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) අධ්‍යාපනික සහතික සහ සිංහල සහ/හෝ දෙමළ විෂයයන් ගෙන් සමත් විභාග සහතික.

7. සේවයේ යෙදවීමේ කොන්දේසි.—(i) මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. (ii) පත් කරනු ලබන අපේක්ෂකයින්, සිය පාඩම් මාලාව

(එනම් දෙවෙනි ශ්‍රේණියේ සැලසුම්කරුවන් සඳහා සේවයට බඳවා ගැනීමේ පරිපාටියේ 3(i) ඡේදයේ නියමිත දෙපාර්තමේන්තු විභාග වලින්) අවංකව හා අනලස්ව හදාරා දෙවෙනි පෙළේ සැලසුම්කරුවන් වශයෙන් සුදුසුකම් ලබාගැනීමටත්, පුහුණුව අවසන් කිරීමෙන් පසු, නියම කරනු ලැබුවහොත්, පස් වර්ෂයකට නොඅඩු කාල සීමාවක් II පෙළ සැලසුම්කරුවෙකු වශයෙන් දෙපාර්තමේන්තුවට සේවය කිරීමටත් බැඳෙමින් දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් පත්‍රයකට ඇතුලත් විය යුතු වේ. මෙම කොන්දේසි හරියාකාර පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නන් සහ ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් ඇපකරුවන් දෙදෙනෙකු ද ඇතුව රු. 5,000ක බැඳුම් කරයකට ඇතුලත් විය යුතුය.

8. **සේවා කොන්දේසි.**—(i) තෝරාගනු ලැබූ ඉහත 4 ඡේදයේ (ii) (අ) යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයින්, දෙපාර්තමේන්තුවේ දෙවර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතු අතර, 4 ඡේදයේ (ii) (ආ) යටතේ සුදුසුකම් ලබන්නන් එක් වර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(ii) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් වීමෙන් පසුව අයදුම්කරුවන් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත II පෙළේ සැලසුම්කරු තනතුරුවලට පත් කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්ට කායසීල ඇතුළත මෙන්ම එලිමහනේද රාජකාරි කිරීමට නියම කරනු ඇත.

9. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් නම් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී අයදුම්කරු මෙම පත්වීම සඳහා නිදහස් කළ හැකිද, නොහැකි ද යන වගද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

10. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) පළාත් පාලන අමාත්‍යාංශය, ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය, රත්මලාන, යන ලිපිනයට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

11. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

12. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ඩබ්. පද්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්).

පළාත් පාලන අමාත්‍යාංශයේ,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන
වැඩ අංශය,
රත්මලාන, 1969.3.1.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

පළාත් පාලන අමාත්‍යාංශයේ, ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ ආධුනික සැලසුම්කරු තනතුරු

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
   (අ) වාසගම :———.
   (ආ) වෙනත් නම් :———.
2. තැපැල් ලිපිනය———.
3. උපන් දිනය :———.
   1969.4.1 දිනට වයස: අවුරුදු :——, මාස :——.
4. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම :—
   (අ) පරම්පරාවෙන් :———.
   (ආ) ලියාපදිංචි වීමෙන් (ලියාපදිංචි වීමෙන් පුරවැසි භාවය ලබා ඇත්නම්, එම සහතිකයේ අංකය හා දිනය සඳහන් කළ යුතුය.) :———.
5. උපන් ස්ථානය—
   (අ) අයදුම්කරුගේ :———.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :———.
   (ඇ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තාගේ :———.
   (ඈ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තාගේ :———.
6. විවාහක ද අවිවාහක ද යන වග :———.
7. අධ්‍යාපනය ලබා ඇති පාසැල් හෝ විද්‍යාලයන්හි නම් (ඇතුල් වූ දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය.) : ———.
8. අධ්‍යාපනික සුදුසුකම් (එම සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කළ යුතුය.) :—
   (අ) සාමාන්‍ය අධ්‍යාපනය :———.
   (ආ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් :———.
9. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් (බැඳුන හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය.) :———.
10. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :———.
11. සිංහල හා දෙමළ පිළිබඳව ලබාගෙන ඇති උසස්ම සුදුසුකම් : ———.
12. දැන්වීමේ 4(ii) ඡේදයේ කුමන උප ඡේදයක් යටතේ ඔබ සුදුසුකම් ලබා ඇත්ද ? :———.
13. වෙනත් කරුණු :———.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සඳහන් කර තිබෙන සියළු විස්තර සත්‍යවූ ද, නිවැරදි වූ ද, කරුණු බව මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත් තෝරා බඳවා ගැනීමට පෙර වරද අනාවරණය වී නම්, නුසුදුස්සෙකු වීමට ද බඳවා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරන බවද දනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

3–470—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

### පළමුවනා පන්තියේ වැද්දුම්කරු තනතුර—සිවිල් ඉංජිනේරු—මහර ගල්වල පෝර්මන් අංශය

කොළඹ වරාය කොමිෂන් සභාවේ සිවිල් ඉංජිනේරු අංශයේ මහර ගල්වලේ පුරප්පාඩු වී තිබෙන ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් "වරාය කොමසාරිස් ඉංජිනේරු අංශය" යනුවෙන් ආමන්ත්‍රණය කර, 1969.3.28 වැනි දින පස්වරු 4.30ට පෙර මෙම කාර්යාලයට ලැබෙනසේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—පළමු හය මස තුළ දෛනික රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 1,170—42—1,674 දරණ වැටුප් ක්‍රමය හිමි වේ.

රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා සහ විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

3. තෝරාගනු ලබන අපේක්ෂකයින් හයමසක (6) දෛනික සේවා කාලයකින් පසු මාසික වැටුප් ක්‍රමයට මාරු කරනු ලැබේ. එවිට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකත්වය හිමිවේ. පත්වීම තෛවසරික ප්‍රවාසන කාලයකට යටත් වේ.

4. **සුසුදුකම් :—**

(i) පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් (අ) පළමුවැනි පන්තියේ වෘත්තීය සේවකයකු වශයෙන් අවුරුදු 6 ක සේවයක් (සහතික මගින් තහවුරු කෙරෙන) හෝ (අ) දෙවැනි පන්තියේ වෘත්තීය සේවකයකු වශයෙන් අවුරුදු 12 ක සේවයක් (සහතික මගින් තහවුරු කෙරෙන) සහිත සේවයක් සමග පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ද තිබිය යුතුයි.

(ii) සූක්ෂම මානයක් කියවීමට හා දශම සටහන් කිරීමට පිළිවන් විය යුතුය.

(iii) ඩීසල් යන්ත්‍ර, වායු පීඩන යන්ත්‍ර යනාදියේ ක්‍රියාකාරිත්වයට පදනම් වන ප්‍රධාන මූල ධර්ම පිළිබඳව සෑහෙන දැනීමක් තිබිය යුතුයි. එබඳු යන්ත්‍රවල තිබෙන දෝෂ සොයා ගෙන ඒවාට පිළියම් කිරීමට පිළිවන් විය යුතුයි.

(iv) සාමාන්‍ය වැද්දුම් වැඩ පිළිබඳ මනා දැනීමක් ද තිබිය යුතුයි.

(v) එබඳු වැඩ සම්බන්ධයෙන් යෙදෙන ඇඳීම කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.

5. තෝරාගනු ලබන අයදුම්කරු වෘත්තීය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ ඉල්ලුම් පත්‍රයට, පහත දැක්වෙන සහතික පිටපත් ඈමිණිය යුතුයි.
   (අ) උප්පැන්න සහතිකය.
   (ආ) ලඟදී ලබාගත් චරිත සහතිකයක්.
   (ඇ) 4 වැනි ඡේදයේ (ii) සිට (v) දක්වා විස්තර කරන ලද පළපුරුදුකම් පිළිබඳ සහතිකය.

7. අවශ්‍ය වුවහොත් කෙටි දැන්වීමකින්, පිට පළාත්වල වැඩට යැමට, සාමාන්‍යයෙන් වැඩ කරන කාලයෙන් පිටස්තර වැඩ කිරීමට සහ මුරෙන් මුර වැඩ කිරීමට සූදානම්ව සිටිය යුතුයි.

8. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුරු සම්බන්ධයෙන් එවන සෑම ලිපියක්ම විමසීමක්ම ඉදිරිපත් කළ යුත්තේ, "වරාය කොමසාරිස්,

ඉංජිනේරු අංශය" කියා මිස මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

9. මේ සම්බන්ධයෙන් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ සඳහා පැමිණෙන ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම් පත් ලැබුණ බව ද දන්වනු නොලැබේ.

10. මෙම අවශ්‍යතාවයනට අදාල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමු විය යුතුයි.

ජී. එස්. පී. විතාන,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1969.3.4 දින.

## පළමුවන පන්තියේ වැද්දුම්කරු තනතුර—සිවිල් ඉංජිනේරු—මහර ගල්වල පෝර්මන් අංශය, කොළඹ වරාය කොමිෂන් සභාව

1. සම්පූර්ණ නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).
4. පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
5. වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–576—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකාර සේවය

ලංකා විදේශ දූත මණ්ඩලවල ලිපිකරු තනතුරු සඳහා, සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් පහත දැක්වෙන උප ලේඛණයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ඒවා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. තවද, විදේශ සේවය සඳහා අයදුම්කරු සුදුසු බවට හා තෝරා ගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරෙන් වහාම මුදා හැරීමට හැකි බවටද, අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සටහනක් අයදුම්පත මත විය යුතුය.

3. කලින් විදේශ දූත මණ්ඩල එකකට වැඩි ගණනක සේවය කර ඇති අය ඉල්ලුම් කළ යුතු නැත.

4. පත් කිරීම සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී ගණන් තැබීම පිළිබඳව කලින් පළපුරුද්දක් ඇති නිලධාරීන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන නිලධාරීන් විදේශ සේවය සඳහා ශාරීරික වශයෙන් සුදුසු දැයි තීරණය කරනු වස් වෛද්‍ය පරීක්ෂණයට භාජන විය යුතුය. තවද, ඔවුනට අවුරුදු හයකට නොවැඩි කාල සීමාවක් විදේශ සේවය කිරීමට නියම වනු ඇත.

6. මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන නිලධාරීන්ට ඔවුන් දැනට දරණ තනතුරට අයත් වැටුපම ලැබෙන අතර, ලංකාවේදී ගෙවන ගෙවල් කුලී, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වෙනුවට විදේශ දීමනාවක් ගෙවනු ඇත. අන්‍ය සේවා කොන්දේසි ලංකා විදේශ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සලසා ඇති අන්දමට වේ.

7. මීට ඉහතදී මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කොට ඇති අයදුම්පත් මේ තෝරා ගැනීමේ දී සලකා බලනු නොලැබේ.

8. අයදුම්පත් 1969 මාර්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම මෙම අමාත්‍යාංශයට ලැබිය යුතුය.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය,
සෙනේට් මන්දිරය,
කොළඹ 1.
1969 මාර්තු මස 1 වැනි දින දී ය.

### උපලේඛනය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නම මුලින්)
2. උපන් දිනය :————.
3. ලිපිනය : කාර්යාලය :————.
පුද්ගලික :————.
4. ජාතිය :————.
5. විවාහක, අවිවාහක බව :————.
6. විවාහක නම් දරුවන් සංඛ්‍යාව :————.
7. අධ්‍යාපන සුදුසුකම් :————.
8. වර්තමාන ශ්‍රේණිය සහ ඊට ඇතුල්වූ දිනය :————.
9. වර්තමාන වාර්ෂික වැටුප :————.
10. දැනට කරන රාජකාරියේ ස්වභාවය :————.
11. ගණන් තැබීමේ පළපුරුදුකම් :————.
12. සිංහල භාෂාවෙහි දැනට ඇති ප්‍රවීණතාවය :————.
13. සිංහල යතුරු ලිවීමේ දැනට ඇති ප්‍රවීණතාවය :————.
14. වෙනත් සුදුසුකම් :————.

ඉහතින් දී ඇති තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–387—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### හැඳල ලාදුරු රෝහලේ වැඩපොල උපදේශක තනතුර

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩපොල උපදේශක තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි මතු දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ අයදුම්පත, 1969 අප්‍රේල් මස 5 වැනි දින හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 960—72—1,752 කි.

3. **සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් විසින්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයෙකින් හෝ සමත්ව තිබීම ;

(ii) කෘතිම අවයව නිෂ්පාදන පිළිබඳ පිළිගත් විකලාංග මධ්‍යස්ථානයක අවුරුදු 5 ක පළපුරුද්දක් තිබීම. ප්‍රායෝගික කාර්මික විද්‍යාලයක සපත්තු සෑදීම සහ මිම් ගැනීම, ඒවායේ සැලැස්ම ඇඳීම හා විකලාංග චිකිත්සක භාණ්ඩ සෑදීම පිළිබඳව විශේෂ පුහුණුවක් ද, පැස්සීම් වැඩ, වැද්දුම් වැඩ, වේවැල් වැඩ සහ වඩු වැඩ පිළිබඳ සාමාන්‍ය පුහුණුවක් ද හමාර කරන ලද ආධුනිකයන්ට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැක. එවැන්නෙකු මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු කොළඹ මහ රෝහලේ විකලාංග චිකිත්සාගාරයේ අවුරුද්දක පුහුණුවකින් පසුව වැඩපොල උපදේශක ලෙස පත් කළ හැක.

5. **වයස් සීමාව.**—අයදුම්කරුවන් 1969 අප්‍රේල් මස 5 වැනි දිනට අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි උපරිම වයස් සීමා බලපානු නොලැබේ).

6. මතු සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට අපේක්ෂකයන් විසින් ඒවා ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය (ඡෑ. ශු. බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාසල්වල රීතිමාලාව යටතේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ මේ සඳහා පිළිගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඉ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලය ශික්ෂකයෙකුගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය) ;

(ඊ) වෘත්තිය සහ/නොහොත් කාර්මික සුදුසුකම් දක්වෙන සහතිකය.

සටහන :

(i) ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ කිසිත් අයදුම්පත් සමග අමුනා නොඑවිය යුතුය ;

(ii) ලියකියවිලි ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ කල එය කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළයුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් වන අතර ඒවා සලකා බලනු ලබන්නේ තනතුර සඳහා තෝරා ගනු ලැබුව හොත් දැනට දරන තනතුරෙන් මුදා හරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ වුවහොත් පමණකි.

8. අයදුම්පත් සහ ඊට සම්බන්ධ වෙනත් ලියකියවිලි එවිය යුත්තේ කොළඹ, තැ. පෙ. 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අමතා මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. මෙම ගැසට් පත්‍රයේ I වන කොටස II වන ඡේදය ආරම්භයේ පළ කෙරෙන රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම්වලට බලපාන්නාවූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

වී. පී. ඒ. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ 1, තැ. පෙ. 500 දරණ
ගාලු මුවදොර ලේකම් පායේ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

### අයදුම්පත් ආකෘතිය

1. සම්පූර්ණ නම :————.
   (i) පෙළපත් නම :————.
   (ii) අනෙක් නම් :————.
2. ලිපිනය :————.
   (ලිපිනය වෙනසක් සිදු වුවහොත් වහාම දැනුම් දිය යුතුය).
3. උපන් දිනය :————.
4. 1969 අප්‍රේල් මස 5 වැනි දිනට වයස :
   අවුරුදු :————, මාස————, දින :————.
5. පියාගේ/භාරකරුගේ නම සහ ලිපිනය :————.
6. ජාතිය සහ පුරවැසි භාවය ලබාගත්තේ කෙසේද ? :————.
7. පහත සඳහන් අයගේ උපන් ස්ථානය :—
   (i) ඉල්ලුම්කරුගේ :————.
   (ii) ඉල්ලුම්කරුගේ පියා :————.
   (iii) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
   (iv) ඉල්ලුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.
8. විවාහකද අවිවාහකද :————.
9. අධ්‍යාපන සුදුසුකම් :————.
10. කාර්මික සුදුසුකම් :————.
11. පාසැලෙන්/විද්‍යාලයෙන් අස්වූ දින සිට කරන ලද රැකියාව පිළිබඳ විස්තර :————.
12. **විශේෂ සුදුසුකම්.**—දැන්වීමේ 4 (ii) ඡේදයෙන් ඉල්ලා ඇති විශේෂ සුදුසුකම් සහ/නොහොත් පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් දින වකවානුව සමග සම්පූර්ණ විස්තර දන්වන්න :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයන්නට යෙදුණ තොරතුරු සැබෑ බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් බොරු බව හෝ වැරදි බව හෝ දැන ගන්නට ලැබුණොත් තෝරා ගැනීමට පෙර නම් එයින් මා නුසුදුස්සෙකු කරනු ලැබිය හැකි බවත්, පත් කිරීමෙන් පසුව නම් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–565—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව

### III ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උප කාර්මික සේවයේ III ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘතිපත්‍රයේ ප්‍රකාර වූ අයදුම්පත් 1969 මාර්තු මස 28 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන පරිදි ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවර "III ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා අයදුම්පත්" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **වැටුප් හා සේවා කොන්දේසි.**—මෙම තනතුරට අදාළ වැටුප් ක්‍රමය මෙසේය :— වර්ෂයකට රු. 1,860 පටන් ගෙන රු. 120 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් ඇතිව වර්ෂයකට රු. 2,580 දක්වා වේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වන අතර පත්වීම් දෙනු ලබන්නේ තෙවර්ෂයක ආධුනික කාලයකට යටත්වය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1969.3.28 වෙනි දිනට අවුරුදු 18 කට නොඅඩු හෝ අවුරුදු 30 කට වැඩි නොවිය යුතුයි. (මෙම වයස් සීමාව දෙපාර්තමේන්තු සේවකයින්ට බලපාන්නේ නැත)

(ii) කටුබැද්ද ප්‍රායෝගික කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව II (විදුලි හා යාන්ත්‍රික අංශ) හෝ ඊට සමාන පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි.

4. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එවැනි අයදුම්පත් නියමිත දිනට පසුව මෙම දෙපාර්තමේන්තුවට ලැබුණහොත්, එම අයදුම්පත් ඒ ඒ අයදුම්කරුවන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නියමිත දිනට කලින් ලැබුණු බව සඳහන් කර එම අයදුම්පත් ප්‍රමාදවීමට සෑහෙන හේතූන් දක්වමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එම අයදුම්පත් භාරගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණක් එසේ ප්‍රමාදව ලැබෙන අයදුම්පත් භාර ගනු ලැබේ.

5. අයදුම්කරුවන් සිය අයදුම්පත්වලට :—

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත්,

(ආ) අයදුම්කරුවන්ගේ චරිත හා මෙම තනතුර සඳහා ඇති සුදුසුකම් පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත් තුනක (මෙම අනු ඡේදය යටතේ දැනට රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය) පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුය.

6. අයදුම්පත් හෝ මේ සම්බන්ධ අන් හැම ලිපිගනුදෙනුවක්ම කළ යුත්තේ වැඩ බලන ප්‍රධාන කළමනාකරු සමග මිස මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියෙකු සමග පුද්ගලිකව නොවේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (II) වැනි ඡේදයෙහි පටන් ගැන්මෙහි පළකර තිබෙන රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එම්. අයි. අසීස්,
වැඩබලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකරු.
රජයේ විදුලි දෙපාර්තමේන්තුව.

රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 540, කොළඹ,
1969 මාර්තු මස 6 වැනි දින.

### අයදුම් කිරීමේ ආකෘති පත්‍රය

#### විදුලි ෆෝමන් III ශ්‍රේණියේ තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. 69.3.28 වැනි දිනට නියමිත වයස—
   අවුරුදු :————, මාස :————, දින :————.

4. උපන් දිනය :————.

5. පුරවැසි බව සහ ලබාගත් අන්දම :————.

පහත සඳහන් අයගේ උපන් ස්ථානය සඳහන් කරන්න :—

(අ) අයදුම්කරුගේ :————

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

අයදුම්කරු ලංකාවේ උපන්නේ නම්, (අ) හෝ (ඇ) සහ (ඈ) යන දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නො උපන්නේ නම්, (අ) වලට අමතරව (ආ) සහ (ඇ) හෝ (ඈ) වෙනම පිරවිය යුතුයි.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු භාවය :————.

(විවාහක නම්, විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න.)

7. (අ) පොදු අධ්‍යාපනය සඳහා :————.

(ආ) වෘත්තිය අධ්‍යාපනය සඳහා :————.

ඉගනිම ලත් පාසල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග :————.

8. අධ්‍යාපනික සුදුසුකම් (ලබා ඇති උපාධි සහ ඒවා ලබාගත් දින, පංතිය සහ ඉදිරිපත් වුණු විෂයයන් සඳහන් කරන්න). අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිනිය යුතුයි :—

9. ලබා ඇති වෘත්තිය හා කාර්මික සුදුසුකම්, යමක් ඇතොත් දින සමග (පිළිගත් ආයතනවල සාමාජිකත්වය ලැබූ ඩිප්ලොමා හෝ වෙනත් සුදුසුකමක් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි) :————.

10. පාසැල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා නියුක්තව සිටි හා හැරගිය දින සමග ලද වැටුප් :—

11. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුදුකම් : ————.

12. ඔබ ගැන කරුණු දැනගැනීමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නාම, ලිපිනය හා නිලතල :————.

13. චරිත සහතික පත් ඉදිරිපත් කර ඇති සම්භාවනිය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුය) :————

14. ඔබ ණය ගැතිකමින් නිදහස් ද නොඑසේ නම් කොතෙක් දුරට ණය ගැතිද :————.

15. ඔබ සතුව මෝටර් රියක් තිබේද ? නැතහොත් මෝටර් බයිසිකලයක් පැදිය හැකි ද ?

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් දැන ගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත්කරගනු ලැබුවාසින් පසු සොයාගතහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3-574—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුරක්

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල භාෂා පරිවර්තක තනතුරු එකක් සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙළ කරන ලද අයදුම් පත් වෂී 1969 අප්‍රේල් මස 4 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප.—මේ තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය : රුපියල් 3,900—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 6,540. වසරකට රුපියල් 5,340 දක්වා වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. සේවයේ කොන්දේසි.—(i) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාර ගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම්, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රති ශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීමද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම්.—හැම අයදුම්කරුවකුම—

(අ) සිංහල භාෂාව විෂයයක් වශයෙන් ඇති උපාධියක් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ අයකු බවට, නැතහොත්

(ආ) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහඅවුරුද්දක පළපුරුදු කම් ඇත්තාවූ හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තේරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු වූ හෝ බවටත්, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ අයකු බවටත් ;

(ඇ) 1969 අප්‍රේල් 4 වැනිදාට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු බවටත් 50ට නො වැඩි බවටත් (දැනට ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අයට මේ වයස් සීමාවන් අදාළ නොවේ.)

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකු විසින්ම පහත පෙනෙන සහතිකවල පිට පත් (මුල් ලිපි නොවේ.) තම අයදුම්පතට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න සහතිකය ලියා පදිංචි කර නැති අපේක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස් පිළිබඳ විශේෂ සහතිකය. (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ) ;

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තිය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගන්නා ලද සහතික තුනක් (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරු වන්ගෙන් මේවා බලාපොරොත්තු නොවේ.)

සැලකිය යුතුයි.—සහතික පත්‍රවල හා චරිත සහතිකපත්‍රවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දින කීපය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු වේ. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසුව මෙහි ලැබුණොත්, ඒ අයදුම් පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්ත මේන්තුවේ ප්‍රධානයාට ලැබී තිබුණහොත් ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම්පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා නිර්දේශ කළහොත් ද පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හටය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවූද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක්ම මෙහි ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාරගන්නා අවසාන දිනයේ සිට තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හට වහාම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකනු නොලැබේ.

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1969 මාර්තු මස 2 වෙනිදා,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598,
22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### සිංහල භාෂා පරිවර්තක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම් :————.
   (ආ) අනිත් නම් :————.

2. ලිපිනය :————.

3. (අ) වර්ෂ 1969 අප්‍රේල් මස 4 වැනි දිනට සම්පූර්ණ වයස : අවුරුදු :————. මාස :————. දවස් :————.
   (ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ හෝ වයස පිළිබඳ විශේෂ සහතිකයේ පිටපතක් අමුනා එවිය යුතුයි) :————.

4. රටවැසිභාවය සහ එය කෙසේ හිමිවීද යන බව :————.

5. (අ) පියාගේ සම්පූර්ණ නම :————.
   (ආ) පියා උපන් දිනය සහ ස්ථානය :————.
   (ඉ) ඔහුගේ රටවැසිභාවය :————.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද, කනවැන්දුම් ද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් සඳහන් කළ යුතුයි) :————.

7. මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.

8. (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි.) සහතික පිටපත් ද අමුණා එවිය යුතුයි :————.
   (ආ) සිංහල සහ ඉංග්‍රීසි භාෂා විෂයයන් වශයෙන් ඇතිව සාමාර්ථය ලත් උසස්ම විභාගය :—
   සිංහල :————.
   ඉංග්‍රීසි :————.

9. (අ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම්, දින සමග විස්තර සඳහන් කරන්න :————.
   (ආ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම්, දින සමග ඒවාද සඳහන් කරන්න :————.

10. (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳ වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.
    (ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, දැනට දරන තනතුර ද වාර්ෂික වැටුප ද සඳහන් කරන්න :————.

11. විශේෂ පළපුරුදුකම්, පුහුණුවීම්, සුදුසුකම් හෝ හිමිකම් : ————.

12. පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ ඥාතීන් නොවිය යුතුයි) :
    (i) ————.
    (ii) ————.
    (iii) ————.

13. චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නොවිය යුතුයි. මෑතකදී ලබාගත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතුයි) :————.

14. මුදල් කරදර නැතිවූවෙක් ද යන වග ; නැතිනම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න) :————.

15. වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම් දෙන්නට පෙර හෙළිවුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමටද, පත්වීම් ලැබුවාට පසු හෙළිවුවහොත් කිසිම වන්දි ගෙවීමක් නැතිව මා නිලයෙන් අස් කිරීමටද යටත් වන බව මම දැන සිටින බවද, මේ අයදුම්පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය බවද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–398—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

විආ/5/119

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ගෘහ විද්‍යාව පිළිබඳ " යුනිසෙෆ් " ශිෂ්‍යත්ව—ඉන්දියාව

1969.1.31 දින අංක 14,839 දරන ගැසට් පත්‍රයේ ඉහත සඳහන් මැයින් පළ කරන ලද නිවේදනයේ 3 වැනි ඡේදය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

**3. සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි.

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1969.7.1 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු විය යුතුයි.

(iii) පහත සඳහන් (අ) සහ (ආ) සුදුසුකම් අතුරින් එකක් ලබා සිටිය යුතුයි.

(අ) අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේදී ගෘහ විද්‍යාව, මැහුම්, ගණිතය හෝ අංක ගණිත, ඉංග්‍රීසි (" අ " හෝ " ආ " නිර්දේශය) සහ සිංහල හෝ දෙමළ (" අ " හෝ " ආ " නිර්දේශය) යටතේ සාමාර්ථයන් ලබා සිටිය යුතු අතර රසායන විද්‍යාව ඇතුලු විෂයයන් හතර කින් එකවර අ.පො.ස. (උසස් පෙළ) සමත් වී සිටිය යුතුයි.

නැතහොත්

(ආ) ගෘහ විද්‍යාව, මැහුම්, ගණිතය හෝ අංක ගණිතය, ඉංග්‍රීසි (" අ " හෝ " ආ " නිර්දේශය) සහ සිංහල හෝ දෙමළ (" අ " හෝ " ආ " නිර්දේශය) ඇතුලු විෂයයන් හයකින් දෙවරකට වැඩි නොවන වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය) හෝ ජ්‍යෙෂ්ඨ පාඨ මාලා සහතික පත්‍රය හෝ සමත් වී සිටිය යුතුයි. (රසායන විද්‍යාව සමත් වූ අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(iv) සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඉගැන්වීමේ හැකියාව තිබිය යුතුයි.

2. 1969.1.31 දින ගැසට් නිවේදනය පරිදි දැනටමත් මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීම අනවශ්‍යය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969.3.28 දක්වා දීර්ඝ කරන ලදී.

ඩී. ජී. දයාරත්න,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 මාර්තු මස 7 වැනි දින,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

3–589—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ප්‍රධාන ආරක්ෂක නිලධාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා මෙහි පහත දක්වෙන සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :—

(අ) පොලිස් දෙපාර්තමේන්තුවේ අවු වශයෙන් 10 වසරක සේවා කාලයක් තිබිය යුතු අතර, මෙයින් අවු වශයෙන් 5 වසරක් ගැසට් කළ නිලධාරියෙකු වශයෙන් සේවය කොට තිබීම ; හෝ

(ආ) පොලිස්/ආරක්ෂක කටයුතුවල අවු වශයෙන් 10 වසරක පළපුරුද්දක් ඇති සන්නද්ධ යුද්ධ හමුදා සේවයේ අධිකාරලත් නිලධාරියෙකු වීම.

(ඇ) වයස—අවුරුදු 30 සිට 50 අතර විය යුතු ය.

**වැටුප් ශ්‍රේණි.**—මසකට රු. 1,250—50—1,500 (සියල්ල ඇතුළත්ව).

**අර්ථසාධක අරමුදල.**—සේවකයාගෙන් සියයට 10 ක් හා සේව්‍යයාගෙන් සියයට 15 ක්.

සියලු ම විස්තර ඇතුළත් ඉල්ලුම් පත්‍ර 69.3.21 දින හෝ ඊට පෙර, කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ ස. තො. ස. සේවක මණ්ඩල කළමනාකරු වෙත ලැබෙන සේ එවිය යුතු ය.

1969. 3. 4,
ස. තො. ස. පාලන අංශය,
21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

සේවක මණ්ඩල කළමනාකරු.

3–605—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## මාම්පුරි කොට්ඨාශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක තනතුර

පුත්තලම දිස්ත්‍රික්කයේ තල්පිටිය ප්‍රාදේශීය ආදයම් නිලධාරිගේ බල ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම් පත් පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙළ කර 1969 මාර්තු මස 31 දින දහවල් 12 ට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුයි. මේ දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් භාරගනු නොලැබේ.

### බල ප්‍රදේශ

මාම්පුරි ගම්සභාව)—.

619 මාම්පුරි ග්‍රාම සේවක කොට්ඨාශය

621 පැනියඩි ග්‍රාම සේවක කොට්ඨාශය

622 කරුකුච්චනෙයි ග්‍රාම සේවක කොට්ඨාශය

623 එතාලෙයි ග්‍රාම සේවක කොට්ඨාශය

626 මුදලප්පලි ග්‍රාම සේවක කොට්ඨාශය

මෙම තනතුරු සඳහා ස්ථිර වැටුපක් ගෙවනු නොලැබේ. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්**.—සෑම අයදුම්කරුවෙක්ම—

(අ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නො අඩු බවට හෝ අවුරුදු 60 ට නො වැඩි බවට,

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත බවට,

(ඇ) ඉහත කී ග්‍රාම සේවක කොට්ඨාශය තුළ ස්ථිර පදිංචි කරුවකු බවට,

(ඇ) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවට,

පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුයි:—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. ඉන් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි.

(ඈ) ස්ථිර පදිංචිය සම්බන්ධයෙන් ග්‍රාම සේවකගේ සහතිකය.

5. මෙම ධුරය සඳහා රජයේ සහ සංස්ථාවල සේවකයන්ගෙන් ද පළාත් පලාන ආයතනවල සාමාජිකයින්ගෙන් ද අයදුම් පත් භාරගනු නො ලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිසාපති,

දිසාපති කාර්යාලය,
පුත්තලම. 1969.2.23

### ආදර්ශ අයදුම් පත

**මාම්පුරි කොට්ඨාශයේ අතිරේක හදිසි මරණ පරීක්ෂක තනතුර**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිකුත් නම් :————.
   (ඇ) ලිපිනය :————.
2. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.
3. (අ) 1969 මාර්තු මස 31 වැනි දිනට වයස :————.
   අවු............මාස............දවස්...............
   (ආ) උපන් දිනය හා ස්ථානය :————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. දූනට කරන රක්ෂාව :————.
7. ණයගැති වී තිබේ ද ? එසේ නම් විස්තර :————.
8. තමා සතු දේපලවල ප්‍රමාණය හා වටිනාකම :————.
9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් විස්තර :————.
10. මෙම තනතුර සඳහා ලබා ඇති විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා :————

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම ලැබීමට පෙර අනාවරණය වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා නිලයෙන් පහ කරනු ලැබීමට ද යටත් විය යුතු බව දනිමි. මෙම අයදුම්පතෙහි දක්වෙන සියළුම තොරතුරු සත්‍ය හා නිරුරදි බවට මෙයින් සහතික කරමි.

...............
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3–335— 69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### සර්ප විෂ පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුර—අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාව

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සර්පවිෂ පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරක් සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 1969 මාර්තු 25 වෙනිදාට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මෙම තනතුරු තාවකාලිකය. දීමනා මුදලක් ගෙවනු ලැබේ.

(ii) තෝරාගන්නා වෛද්‍යවරයාගේ වැඩ සතුටුදායක වුවහොත් අලුත් කිරීමට ඉඩ තබා, පත්වීම වර්ෂයකට සීමා වෙයි.

(iii) ඔහුගේ සේවය අසතුටුදායක වුවහොත් වහාම නැවැත්විය හැකියි.

(iv) ඔහු හදිසි අවස්ථාවන්හි කැඳවීමට සිදුවන හෙයින්, අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාව කිට්ටුව පදිංචිවීමට කැමැත්ත පළ කරන අයදුම්කරුවන් කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(v) තෝරාගනු ලැබූ වෛද්‍යවරයා මෙම දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කැරෙන කොන්දේසි අනුව සේවය කළ යුතුයි.

(vi) තනතුර සම්බන්ධයෙන් විශේෂඥතාවයක් හා පළපුරුද්දක් ඇති බව ඔප්පු කිරීමට සෑහෙන පමණ කරුණු ඉදිරිපත් කළ යුතුය.

(vii) තෝරා ගනු ලබන අයදුම්කරු ආරෝග්‍යශාලාවේ හා බාහිරාංශයේ රෝගීන්ට ප්‍රතිකාර කළයුතු අතරම, ආරෝග්‍යශාලාවේ පුහුණුව ලබන පශ්චාත් උපාධිධාරීන්ට පුහුණුවක් ද ලබාදිය යුතුය.

3. **අවශ්‍ය සුදුසුකම් :**

අයදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාව විසින් ලියාපදිංචි කරනු ලැබූ වයස අවුරුදු 35 කට අඩු නොවන වෛද්‍යවරයන් හැටියට අඩු වශයෙන් අවුරුදු 15ක පළපුරුද්දක් ඇති අයවලුන් විය යුතුය.

4. **දීමනා**.—මෙම තනතුර සඳහා එක් මසකට රු. 450ක දීමනාවක් ගෙවනු ලැබේ. දිනපතාම (නිවාඩු දිනයන් හැර) ඔවුන් ආරෝග්‍ය ශාලාවේ සේවය සඳහා පැමිණිය යුතුය.

5. ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතික වල පිටපත් ද එවිය යුතුය :—

(i) අධ්‍යාපනය සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත් ඇත්නම් ඒවායේ පිටපත්,

(ii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් ලද සහතික පිටපත්.

6. අයදුම්පත් හා සෙසු ලිපි ආදිය මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට නොව, " ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝච්චේ පාර, කොළඹ 8 " කියා එවිය යුතුය.

7. යම් ඉල්ලුම්කරුවකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයතා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බල පැවැත්වීමකට උත්සාහයක් දැරුවහොත්, ඒ හේතුවෙන් ම එකී ඉල්ලුම්කරුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

1969 මාර්තු මස 4 දින,
කොළඹ 8.
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදී ය.

### ආකෘති පත්‍රය

**ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සර්ප විෂ පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුර**

1. සම්පූර්ණ නම :————.
2. වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ අංකය :————.
3. ලිපිනය :————.
4. උපන් දින හා වයස :————.
5. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. විශේෂ සුදුසුකම් සහ මේ සඳහා කිවහැකි වෙනත් කරුණු පිළිබඳ විස්තර :————.
9. අයදුම්කරු සම්බන්ධයෙන් තොරතුරු කිවහැකි ඥාතීන් නොවන තුන් දෙනෙකුගේ නම්, තරාතිරම් හා ලිපිනය :————.
10. වෙනත් කරුණු :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–476—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**1968/69 අධ්‍යයන වාරයට අධ්‍යයන නිවාඩු දීමට දන්ත ශල්‍යඥයින් තේරීම**

1969 අප්‍රේල් 10 වනදා වයස අවුරුදු 40 ට පහළ සිටින්නාවූද, පත්වීම් තහවුරු කරනු ලැබ සිටින්නා වූද, I වන ශ්‍රෙණියේ හෝ II වන ශ්‍රෙණියේ හෝ සිටින්නා වූද දන්ත ශල්‍යඥයින්ගෙන් මෙහි මතු (1) සහ (2) වන තීරුවල දැක්වෙන සුදුසුකම් ලබා ගැනීමට අධ්‍යයන නිවාඩු දීම සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්කරුවන්, මෙහි මතු (3) වන තීරුවේ දැක්වෙන සුදුසුකම්—

(1) දැනට මත් දරමින් හෝ,

(2) 1969 ඔක්තෝබර් 1 වන දාට කලින් ලැබතැයි සිතිය හැකිව හෝ සිටිය යුතුයි.

| (1) විශේෂිතය | (2) සුදුසුකම් | (3) නිසිකම් | (4) ශිෂ්‍යත්ව කාල සීමාව |
|---|---|---|---|
| දන්ත වෛද්‍ය කර්මය ... | එප්ඩීඑස්ආර්සීඑස ය ... | ප්‍රාථමික එප්ඩීඑස්ආර්සීඑස ය ... | අවුරුදු 2 යි |

2. එප්ඩීඑස්ආර්සීඑස් සුදුසුකම් දරන දන්ත ශල්‍යඥයින් විශේෂඥයින් හැටියට පත් කරන්නේ විශේෂඥ දන්ත ශල්‍යඥ සංඛ්‍යාවෙහි ඇබෑර්තු තිබේ නම් පමණි.

3. අධ්‍යයන නිවාඩු දීමට තෝරා ගනු ලබන නිලධාරීන්ට මතු සඳහන් වරප්‍රසාද දෙනු ලැබේ :—
   (i) නියමිත කාලසීමාව ඇතුළත සපුරා වැටුප්,
   (ii) එංගලන්තයට යාමටත්, ආපසු පැමිණීමටත් රජයේ වියදමින් නැවු යාන පත්‍රයක්,
   (iii) (තමන්ගේ ගුරු පඩුරු හැර) අනුදත් අධ්‍යයන සහ අභ්‍යාස පාඨ මාර්ගයේත්, නිලධාරියා ජය ලබන විභාගයේත් සියලු ගාස්තු,
   (iv) නිලධාරීන්ට රටින් පිට වී සිටීමට සිදුවන සමය තුළ අංක 276 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය ප්‍රකාර ගෙවීමට තිබෙන දීමනා.

4. මතු සඳහන් බරපද කොන්දේසි ගැබ් වූ ගිවිසුමකින් බැඳෙන ලෙස නිලදාරීන්ට නියම කරනු ඇත :—
   (i) නියමිත කාලසීමාව ඇතුළත නියමිත සුදුසුකම් ලබන බවට,
   (ii) දිවයිනට පෙරළා පැමිණි පසු 15 අවුරුද්දක් රජයට සේවය කරන බවට (සේවයෙන් පහ කරනු ලැබීම සේවයේ රැඳී සිටීමට අපොහොසත් වීමක් සේ සැලකේ).
   (iii) පෞද්ගලික වෙදකමේ යෙදීමෙන් වැළකී මුළු කාලය ම යොදවා සේවය කරන බවට,
   (iv) ගිවිසුමේ ගිවිසගත් බරපද කොන්දේසි සතුටුදායක ලෙස ඉටු කිරීමට අපොහොසත් වුවොත්, රජය තීරණය කරන පරිදි නියමිත මුදල් ගණන් ආපසු ගෙවීමට යටත් බවට.

5. නා නා අභ්‍යාස මධ්‍යස්ථානවල ඉඩකඩ සහ පහසුව ලබා දීමට දෙපාර්තමේන්තුව වෑයම් දරනු ඇත. එක්සත් රාජධානියේ ලංකා මහ කොමසාරිස්තුමා මගින් වැඩ පිළිවෙල යොදනු හැකි වනු පිණිස, තමන්ගේ උවමනාවන් මා වෙත දන්වන ලෙස තේරී එන නිලධාරීන්ට දන්වා සිටිමි.

6. විශේෂ සැලකිල්ලක් ලැබීමට හේතු තිබේ නම් එය ද සඳහන් කරමින් තම අයැදුම් පත්, 1969 අප්‍රේල් 10 වන දා නො ඉක්මවා මේ කාර්යාලයට ලැබෙනු පිණිස එවන මෙන් නිලධාරීන්ගෙන් ඉල්ලමි. අයැදුම් පත් හැකි තරම් දුරට සියලු කරුණුවලින් පිරිපුන් විය යුතුය. අවලංගු සේ සැලකෙන පසු ගිය අයැදුම් පත් ගැන සඳහනක් හෝ, ඒවාට සම්බන්ධයක් හෝ මෙහි නො දැක්විය යුතුයි.

7. අයැදුම් පත් ලැබුණු බව දන්වා එවනු ඇත.

ඩී. බී. ගුණසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1969 මාර්තු 6 වන දා,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දිය.

3–567—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**ඇබෑසි ෆෝමන් තනතුරු**

නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ ඇබෑසි ෆෝමන්වරු වශයෙන් පත් කිරීමට අම්පාරේ, හාඩි කාර්මික ආයතනයේ ඩිප්ලෝමාව හෝ කටුබැද්දේ ලංකා කාර්මික විද්‍යායතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය හෝ මැතදී ලබාගත් අයගෙන් අයදුම් කැඳවේ.

ඉහත සඳහන් විභාගයන්ගේ අවසාන පරීක්ෂණයන්ට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගේ අයදුම් ද සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 2 ක කාලයක් තුළ පුහුණුවිය යුතු අතර, එකී කාලය තුළදී සියලු දීමනා අඩංගු රු. 300 ක මාසික දීමනාවක් ගෙවනු ඇත. සංයුක්ත මණ්ඩලය විසින් නියම කෙරෙන තත්ත්වය ලබන පුහුණුවන්නන්—

රු. (360 — 450) / (6 × 15) (මාසික සියලු දීමනා අඩංගුව)

වැටුප් ක්‍රමයේ මුල් හිණ මත II වෙනි ශ්‍රෙණියේ ෆෝමන්වරුන්ගේ තනතුරු සඳහා පත්කිරීමට සලකා බලනු ඇත.

තවද, පහත දැක්වෙන වැටුප් ක්‍රම මත ඉහළ ශ්‍රෙණිවලට උසස් විය හැක:—

1 වෙනි ශ්‍රෙණිය රු. (400 — 600) / (8 × 25) (මාසික සියලු දීමනා අඩංගු)

ජ්‍යෙෂ්ඨ ශ්‍රෙණිය රු. (550 — 750) / (8 × 25) (මාසික සියලු දීමනා අඩංගුව)

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල, අයදුම්කරුගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1969.3.28 දිනට හෝ ඊට පෙර මෙහි පහත ඇති ලිපිනයට සාමාන්‍යාධිකාරි වෙතට ලැබෙන සේ එවිය යුතුය.

අයදුම් ආකෘති පත් සඳහා තැපෑලෙන් අයදුම් කරන විට තම ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

අයදුම් කළ යුත්තේ ඉහතින් දක්වා ඇති සුදුසුකම් ඇති අය පමණකි

තී. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ.පෙ. 1367,
135, යූනියන් පෙදෙස,
කොළඹ 2. 27.2.69

3–617—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ඇබෑර්තුවක්

මණ්ඩලීය සේවාවේ පර්යේෂණ විනි යෝජන හා සංවර්ධන කොට්ඨාශයේ V, IV හෝ III වෙනි ශ්‍රේණියේ අර්ථ ශාස්ත්‍රඥ තනතුරක් සඳහා ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**2. පඩි ක්‍රමයන් :**

III ශ්‍රේණිය—සියලු දීමනාවන් ඇතුලුව මසකට රු. 1,100—50—රු. 1,700. කාර්යක්ෂමතා කඩඉම රු. 1,350 ට ප්‍රථමයෙනි.

IV ශ්‍රේණිය—රු. 700—40×5—50×6—රු. 1,200. කාර්යක්ෂමතා කඩඉම රු. 900 හා රු. 1,050.

V ශ්‍රේණිය—රු. 600—40—රු. 1,000. කාර්යක්ෂමතා කඩඉම රු. 800 හා රු. 920.

සැ. යු.—තෝරාගනු ලබන අපේක්ෂකයා සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් පඩි ක්‍රමයන්හි සුදුසු පියවරක තැබිය හැකිය.

**3. සුදුසුකම් :**

(i) වයස : 1969.3.1 වෙනිදාට අවුරුදු 27—35 ටත් අතර විය යුතුයි.

(ii) අර්ථ ශාස්ත්‍රය පිළිබඳ 1 වෙනි පංතියේ හෝ 2 වෙනි පංතියේ ගෞරව උපාධියක්. ගමනාගමන කටයුතු සම්බන්ධයෙන් ලබා ඇති සුදුසුකම් හා ගමනාගමන සංවිධානයක කටයුතු කර ලැබූ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වන්නේ ය.

සැ. යු.—තෝරාගනු ලබන අපේක්ෂකයා සුදුසුකම් අනුව V වෙනි, IV වෙනි හෝ III වෙනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4. (අ) රාජ්‍ය සේවාවේ හෝ ප්‍රාදේශීය පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.

(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දැන්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරි මහතා ඔවුන් (පත්කිරීමට) තේරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

**5. සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයා 1 වෙනි වතාවට තුන් අවුරුදු ප්‍රවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසිවලට යටත් විය යුතුයි :—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(2) දැනටමත් පණවා ඇත්තාවූද, කලින් කල පණවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, ප්‍රවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 15කි.

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති විය යුතුයි.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන වෙත 1969යේ මාර්තු මස 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල කළමනාකාර තැන.

කොළඹ 5, කිරුළ පාරේ
අංක 200 වෙනි ස්ථානයේදීය.

## ලංකා ගමනාගමන මණ්ඩලය

### (ඉල්ලුම් පත්‍ර පෝර්මය)

1. ඉල්ලන තනතුර :————.
2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.
3. ලියුම් ලැබෙන පිළිවෙල :————.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් අමුණන්න.)
5. 1969.3.1 දිනට වයස :—අවුරුදු :——, මාස :——, දවස් :——.
6. ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.
7. විවාහකද, අවිවාහකද යන බව :————.
   (විවාහක නම් විවාහවූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න.)
8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය :————.
   (ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත්වූ විභාගයද දිනයන් සහිතව සඳහන් කරන්න.)
9. උසස් අධ්‍යයනය (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.) (සහතිකපත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න) :————.
10. වෛධික සුදුසුකම් (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත් වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න.) (සහතික පත්‍රවල මුල්පිටපත් නොව අනුපිටපත් අමුණන්න) :————.
11. (පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. එනම් දැරූ පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස්කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු) :————.
12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පළාත්පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන්කිසි ආයතනයක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර (දැරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළුවූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න) :————.
13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :————.
    (මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂේප විස්තරයක් ලියන්න.)
14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහලම ප්‍රමාණය :————.
15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද? :————.
16. සෙසු විස්තර :————.
17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරුවෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.
18. ඔබ ගැන තොරතුරු දැන ගැනීමට සුදුසු නෑනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න.

    1. ..................................................
    ..................................................
    ..................................................

    2. ..................................................
    ..................................................
    ..................................................

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැන ගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලම්කරුවාගේ අත්සන.

දිනය :————.

3–549—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාර අංකය : 1/23/36 (ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කාර්‍යක්ෂමතා කඩඉම් විභාගය (සිංහල/දෙමල/ඉංග්‍රීසි)—1969 මැයි

1966.10.23 වැනි දින අංකය ජී (134), 1968.2.7 වැනි දින අංකය ජී (170) සහ 1968.11.16 දින අංකය ජී (199) දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපි මගින් සංශෝධිත, 1955 10.1 දින අංක 10,844 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලඝු ලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ සඳහන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කාර්‍යක්ෂමතා කඩඉම් විභාග 1969 මැයි මස 15 වැනි දින සිට කොළඹ දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාග විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීති වලට විභාගාපේක්ෂකයන් යටත්වේ. විභාගාපේක්ෂකයන් සඳහා වූ නීතිරීති මෙම නිවේදනය අවසානයේ වෙනම පළකර ඇත.

3. මෙම විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කර ගත යුතු ය. අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ බාග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයක කඩදාසියක නොවේ. මේ සඳහා එක කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුය. අයදුම් පත්‍රය ටයිප් කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය. 1969 අප්‍රේල් 10 වැනි දින හෝ එයට පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි, අයදුම් පත්‍ර, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය. අයදුම් පත්‍ර විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්‍යය සඳහා නව ප්‍රවේශක නිලධාරීහු ඔවුන්ගේ අයදුම් පත්‍ර රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කොට එම භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වුව ද, ආදි ප්‍රවේශක නිලධාරීන්ට ස්වකීය කැමැත්ත පරිදි රාජ්‍ය භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් තමන්ගේ අයදුම් පත්‍ර පිළියෙල කිරීමට හා පිරවීමට හැකිය.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුන බව පහත සඳහන් විස්තර සමඟ කොළඹ තැ.පෙ. 1503, කොම්පඤ්ඤ වීදියේ, මැලේ වීදියේ විභාග කොමාසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය : ''විභාග'', කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතු ය :—

(1) විභාගයේ නම :————.

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(3) සම්පූර්ණ ලිපිනය :————.

(4) තැපැල් කාර්‍යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය:————.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 මාර්තු මස 6 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

### අයදුම් පතේ ආදර්ශ ආකෘති පත්‍රය

## ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහල ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කාර්‍යක්ෂමතා කඩඉම් විභාගවලට (සිංහල/දෙමල/ඉංග්‍රීසි) ඇතුළත්වීමේ අයදුම් පත 1969 මැයි

විභාග අංකය :————.

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණයි)

1. ඉල්ලුම්කරුගේ අගට යෙදෙන නම මුලකුරු සමඟ (මහතා/මහත්මිය/ මෙනෙවිය) (පැහැදිලි අකුරෙන්) :————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :————.
3. කාර්යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම සහ කාර්යාලයීය ලිපිනය :————.
4. ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයට ඇතුළුවූ දිනය :————.
5. රාජ්‍යා භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද නව ප්‍රවේශකයෙක් ද ? :————.



6. මීට ඉහත පැවැත් වූ විභාගයක දී ලඝුලේඛන සහ යතුරු ලේඛනය හෝ සිංහල/දෙමල යන විෂයයන්ගෙන් ඔබ සමත් වූයෙහි ද ? එසේ නම් විභාගය පැවැත් වූ දිනය සඳහන් කරන්න. :————.
7. අංකය පී (31) සහ 1964.9.9. වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාර සිංහල විෂයයෙන් ඔබ නිදහස් කරන ලද්දේ නම් එසේ නිදහස් කරමින් එවන ලද භාණ්ඩාගාර ලිපියේ යොමුව සඳහන් කරන්න :————.
8. ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය (I හෝ II) ඒ පරීක්ෂණයයේ විෂයයන් හා මාධ්‍යය සඳහන් කරන්න:—

*අදල නොවෙන වචන කපා හරින්න.

මා විසින් ඉහත දක්වන ලද විස්තර සත්‍ය බැව් සහතික කරමි. මේ විභාගයේ රෙගුලාසි පිළිපැදීමට මම එකඟවෙමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සපයා ඇති තොරතුරුවල නිවැරදි බව පිරික්ෂන ලදුව, ඒවා නිවැරදි බැව් හෙළි වූ බවත්, අයදුම්පත් ආකෘතියේ 8 වැනි කොටුවේ සඳහන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂකයා සුදුස්සකු බවත් මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

පදවි නාමය :————.

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියළුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ:—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස් සෙකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව කෙසිම අවස්ථාවක දී වුවත් එවැනි විභාග අපේක්ෂකයෙකු හෝ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමාසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතු ය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම් කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිට වී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතු ය. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතු යි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්‍ය මණ්ඩලයේ කෙනෙකු සමඟ හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදුවනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදසියෙහි හැර තීන්ත පොවන කඩදසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතු යි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවෙන් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වෙ.

8. තමන් වෙත සපයන ලද කඩදසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නවා දැමීම හෝ අකා මකා දැමීම හෝ නො කළ යුතු ය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දි ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්ණයට පිළිතුරු දෙ තැනක ලිය වී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත්ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපෙක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූප යෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යානාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම ද විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාව කින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදසි කොළ හෝ කැබැලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවල දී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, fපයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදව් දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් වැලකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදසියක් ම ලියමින් සිටින කඩදසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවහොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියෙකුගේ සුපරික්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවැත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන්ගැනීමට පෙර හෝ නියම විභාගාපෙක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපෙක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්ණ පත්‍රයට ප්ළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටිමේ දී අනන්‍යතා පත්‍ර (හැදින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගාශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතු ය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රශ්තා ර කඩදසි, ලැජ්ර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙද දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියක් වත් ප්‍රශ්ණවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවැත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබ ගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් එවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිතිය උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙ පැත්තේම පැහැදිළිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්ණයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංකය ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්ණ අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැණ බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග කුරුවලදී

එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවෙකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකට හෝ බාර නො දිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතු ය.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

3–525—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ, 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය :—තැ. පෙ. 500, කොළඹ 1,) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| ශ්‍රේණියන් | | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. ඉංග්‍රීසි යතුරු පුවරුවෙන් යුත් යතුරු ලියන සැපයීම | ... | 1969.4.15 |
| 2. සිංහල යතුරු පුවරුවෙන් යුත් යතුරු ලියන සැපයීම | ... | 1969.4.22 |
| 3. දෙමළ යතුරු පුවරුවෙන් යුත් යතුරු ලියන සැපයීම | ... | 1969.4.29 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1969 මාර්තු මස 14 වෙනි දින,
කොළඹ දීය.

3–577—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## 1968-69 මුදල් වර්ෂය තුල අනුරාධපුර බන්ධනාගාරයට කැලෑ දර සැපයීම

පහත අත්සන් කරන මවිසින් අනුරාධපුර බන්ධනාගාරයට 1968-69 මුදල් වර්ෂය තුලදී දර සැපයීම සඳහා ටෙන්ඩර් 1969 මාර්තු මස 30 වෙනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

සැපයීම් පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු. විෂ්කම්භය අඟල් 3 කට නොඅඩු වූද, අඟල් 12 කට නොවැඩි වූද, දිග අඟල් 18 කට නොඅඩුවූද, අඟල් 36 කට නොවැඩි වූද, ඉතා හොඳට වියලුනු, තද, ඡම්රු, ගැටවලින් තොර වූද, දර කැබලි එවේලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්වයක ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කටුකැරුල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මිහිරිය, දන්, මොර, කුඹුක්, මූනමල්, මාදම්, අලුබෝ ආදී තද ලී වර්ගවලට ඇතුලත් විය යුතුයි. හොණ්ඩරයකට රාත්තල් 14 සිට 28 දක්වා වූ ප්‍රමාණයකින් වියලීමට හා පොතුවලට අඩු කරනු ලැබේ.

එමෙන්ම කැන්ද, ඇටඹ, රුක්-අත්තන, ගැමලියා, සපු, අඹ, ඇල්බීසියා, මාර, කැකුණ, ඊරිය, හිත්, මලබොඩ ආදී බුරුල් ලී වර්ගවලට අයත් දර භාර ගනු නොලැබේ. කැලෑ දර සහ රබර් දර හොන්ඩරයක මිළ වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

2. බන්ධනාගාරයේ හෝ කිට්ටු කච්චේරියක රුපියල් 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අධිකාරිගෙන් 1969 මාර්තු මස 29 වෙනි දින පස්වරු 3 දක්වා දර සැපයීම සඳහා ආකෘතිපත්‍ර ලබා ගත හැක. එම ආකෘතිපත් සමග අනු පිටපතක්ද එවිය යුතුයි. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවසි නොවේ.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

3. ටෙන්ඩර්පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙලවරෙහි "දර සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර" යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එම ටෙන්ඩර්පත්‍ර තැපැලෙන් එවනු නොලැබේ නම් ටෙන්ඩර්කරු විසින් බන්ධනාගාර ගේට්ටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහා ලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි මිළ ගණන් අකුරෙන් හා ඉලක්කමින් ද විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

5. තෝරා ගත් ටෙන්ඩර්කරු දන්වා යවා දින 10 ක් ඇතුලතදී රුපියල් 350 මුදලින් ඇපයක් තබා බන්ධනාගාර අධිකාරි තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුනහොත් ඔහු විසින් තැන්පත් කල ටෙන්ඩර් මුදල රාජසන්තක වීමටද ඔහුගේ නාම රජයේ කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛණයට ඇතුලත් වීමට ඉඩ ඇත.

6. හැම ටෙන්ඩරයක්ම 1969 මාර්තු මස 30 වෙනි දින පෙරවරු 10.35 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාර ගත් අවසාන දින සිට මාස 3 ක් යන තුරු ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩර්පත්‍ර සැලකිල්ලට භාජනය කිරීමට ඉඩ තැබිය යුතුය.

ඊ. සී. ප්‍රේමතිලක,
බන්ධනාගාර අධිකාරි.

අනුරාධපුරය,
69.2.26

3–559—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

දළ වශයෙන් ටොන් 150 ක යකඩ සුන්බුන් ලබාගත හැකි, සේවයට අයෝග්‍ය වතුර බත්තලයක් විකිණීම සඳහා කොළඹ, තැ. පෙ. අංක 593, රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අප්‍රේල් මස 10 වෙනි බ්‍රහස්පතින්දා උදේ 10.30 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ, කොඩිගහ වීදියේ පිහිටි නාවික හමුදා මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරි (ගබඩා පාලන) තැනගෙන් ලබාගත හැකි ආකෘති පත් උපයෝගී කර ගනිමින් පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉල්ලුම් පත් එවිය යුතු ය. කොළඹ, කොඩිගහ වීදියේ, නාවික හමුදා මූලස්ථානයේ මුදල් හා සිවිල් පාලන අධ්‍යක්ෂකගේ කාර්යාලයට රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1969 මාර්තු මස 30 වෙනි ඉරිදා වන තෙක් මාණ්ඩලික නිලධාරි (ගබඩා පාලන) විසින් ටෙන්ඩර් කොන්දේසි සහ ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

3. කොළඹ, කොච්චිකඩේ, රා. ලං. "රංගල" ආයතනයේ අණදෙන නිලධාරි සමග කටයුතු පිළියෙල කිරීමෙන් අනතුරුව කොළඹ, කොච්චිකඩේ දී මෙම වතුර බත්තලය පරීක්ෂා කළ හැක.

4. අවශ්‍ය නවත් විස්තර කොළඹ 1, කොඩිගහ වීදියේ, රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරි (ගබඩා පාලන) තැනගෙන් ලබාගත හැක.

ආර්. කදිර්ගාමර්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාපති.

1969 මාර්තු මස 4 දින,
කොළඹ, තැ. පෙ. 593,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ දීය.

3–465—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ක්‍රියා විරහිත මෝටර් රථ විකිණීම

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ තිබෙන පහත සඳහන් ක්‍රියා විරහිත වාහන විකිණීම සඳහා 1969 මාර්තු 31 වෙනි දින පෙ. ව. 10 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

(i) ලෑන්ඩ් රෝවර් 109" වීල් බේස් වාහන අංක ඒ. එෆ්. 2301.

(ii) බෙඩ්ෆෝර්ඩ් මගීන්/බඩු ගෙනයන වෑන් වාහන අංක ඒ. එෆ්. 2063.

(iii) පෝඩ්සන් තේම්ස් ටොන් 3 වාහන අංක ඒ. එෆ්. 2025.

(iv) වැන්ගාඩ් ෆේස් 11 වාහන අංක ඒ. එෆ්. 2265.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත නැවත ලබා ගත හැකි රු. 150 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1969 මාර්තු 30 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරේ.

3. වැඩි විස්තර, කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදා ආඥාපති.

3–542—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### මූලික මිල ගණන් කැඳවීම

මෙහි පහතින් අංක 5 සිට 7 දක්වා සලකුණු කර ඇති යෝජනා ක්‍රම තුනට යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා වූ මූලික මිල ගණන් ලංකාවේ, කොළඹ, නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය විසින් කැඳවනු ලැබේ:—

යෝජනා ක්‍රම—ස්ට්‍රෝ බෝර්ඩ් කම්හල

යෝජනා ක්‍රම—පිෂියු කඩදාසි කම්හල

යෝජනා ක්‍රම—කඩදාසි හා කඩදාසි බෝඩ් ආලේපිත කිරීමේ කම්හල.

ඉදිරිපත් කරනු ලබන මූලික මිල ගණන්, කාර්මික හා මුදල් අරමුණු හා අදාලව විග්‍රහ කරන අතර, සතුටුදායක වෙතොත්, ලංකා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙතට ලංකාණ්ඩුවේ අනුමතියෙන් පසුව සම්පූර්ණ හා විස්තරාත්මකව කරුණු සපයනු ලැබේ.

මූලික මිල ගණන් සකස් කිරීම සඳහා අවශ්‍ය වන කරුණු හා අදාල ලුහුඬු සටහන් පොදු වගන්ති හා කොන්දේසි දැක්වෙන සංදේශයක් සපයනු ලැබේ.

ප්‍රථම වශයෙන් මූලික මිල ගණන් කැඳවනුයේ යන්ත්‍රෝපකරණ සැපයීමේ මූලිකයන් වෙතින් හෝ කල්ක හා යන්ත්‍රෝපකරණ හා අනෙකුත් විදුලි හා කාර්මික ද්‍රව්‍ය නිෂ්පාදන මූලිකයන් වෙතින් හෝ ඔවුන්ගේ අනුමත කරන ලද නියෝජිතයන් විසිනි.

ඉහත දැක්වෙන යෝජනා ක්‍රමයන්ගෙන් ඕනෑම යෝජනා ක්‍රමයක් සඳහා මූලික මිල ගණන් ඉදිරිපත් කළ හැක.

සියලුම මිල ගණන් පිටපත් තුනකින් දැක්විය යුතු අතර, සෑම පිටපතක්ම අත්සන් කර, එකම කවරයක බහා කවරයේ පිට වම් කෙළවරේ "යෝජනා ක්‍රම අංක සඳහා වූ මිල ගණන්" යනුවෙන් සඳහන් කර ලංකාවේ කොළඹ, තැපැල් පෙට්ටිය 1367, අංක 135, යූනියන් පෙදෙස, නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය සභාපති, යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට තැන්පත් කළ යුතුයි.

සියලු මූලික මිල ගණන් 1969 ජූනි 30 දින පස්වරු 2ට පෙර නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයෙහි සභාපති වෙතට එවිය යුතුයි.

කේ. සී. තංගරාජා,
සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

1969 පෙබරවාරි 20,
කොළඹ 2, යූනියන් පෙදෙස,
අංක 135 දීය.

3–508—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ කොලොන්නාවේ පරීක්ෂණ රසායනාගාරය සඳහා වායු සමීකරණ යන්ත්‍ර සපයා ඉදිකිරීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැනා වෙත ඉහත සඳහන් කාර්ය කර බාරදීම සඳහා ටෙන්ඩර්පත්‍ර වර්ෂ 1969 ක්වූ මැයි මස 9 වන සිකුරාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනා (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ පාසන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැනා වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. එකී 1969 ක්වූ මැයි මස 6 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1969 ක්වූ මැයි මස 9 වන සිකුරාදා පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැඩ බලන ප්‍රධාන කළමනාකාර තැනා.

තැ. පෙ. 540,
කොළඹ,
1969 ක්වූ මාර්තු මස 14 වෙනි දින දීය.

3–551—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## හිනිදුම නානායමට ජල සම්පාදන ක්‍රමයක් තැනීම

ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම් පත්තුවේ හිනිදුම නානායමට ජල සම්පාදන ක්‍රමයක් තැනීම සඳහා ටෙන්ඩර්, 1969.3.31 දින පස්වරු 3 වන තෙක් ගාල්ලේ දිසාපති විසින් බාර ගනු ලැබේ.

2. රු. 100ක ආපසු ගෙවිය හැකි ටැන්ඩර් තැන්පත් මුදලක් මෙම කච්චේරියේ තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කොට ඒ සඳහා ටැන්ඩර් ආකෘති පත් 1969.3.29 දින තෙක් මෙම කච්චේරියේ පාලන අංශයෙන් ලබාගත හැක.

3. රු. 25,000කට නොඅඩු වටිනාකමකට ලියාපදිංචිවී ඇති මෙවැනි වැඩ ගැන පළපුරුදුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන, සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, සහ තනි පුද්ගලයින්ට මේ සඳහා ටැන්ඩර් ඉදිරිපත් කළ හැක. සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති එකී දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් තමන්ගේ හැකියාව තහවුරු කරමින් ලබාගත් සහතික ඉදිරිපත් කළයුතු වන්නේය. එසේ අනුමත සමිති ටැන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමේ අවශ්‍යතාව යෙන් මුදාහරිනු ලැබේ.

4. අනු පිටපතක්ද සහිත ටැන්ඩර් මුද්‍රා තබන ලද කවරයක බහා එහි පිට වම්පස උඩු කෙළවරේ "හිනිදුම නානායමට ජල සම්පාදන ක්‍රමය සඳහා ටැන්ඩර්" යනුවෙන් පැහැදිලිව ලියා, ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ පුද්ගලිකව ගෙනැවුත් කච්චේරියේ කාර්යාල සහකාරගේ කාමරයෙහි ඒ සඳහා තබා ඇති ටැන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, අවසාන දිනය හා වේලාව ඉකුත්වීමට පෙර මා වෙත ලැබෙනසේ එවිය යුතුය.

5. 1969.3.31 දින පස්වරු 3.30ට දිසාපති කාමරයේදී ලැබී ඇති ටැන්ඩර් විවෘත කරනු ලැබේ. ඒ අවස්ථාවෙහිදී ඒ ටැන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය. ටැන්ඩර් සම්බන්ධයෙන් ඇතිවන ගැටලුවකදී දිසාපතිගේ තීරණය අවසාන තීරණය වන්නේය.

6. වැඩිදුර විස්තර දිසාපති කාර්යාලයේ සුළු මාර්ග අධිකාරිගෙන් ලබාගත හැක.

ගාල්ලේ ආණ්ඩුවේ ඒජන්ත.

1969 මාර්තු මස 6 වැනිදා,
ගාල්ලේ කච්චේරියේ දීය.

3–523—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුලු දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩය සඳහා 1969 අප්‍රේල් මස 4 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

**වැඩෙහි ස්වභාවය.**—මැදිකිඳ ප්‍රා. ආ. නි. කොට්ඨාසේ, ඇල්ල-කිතල් ඇල්ල පාරේ 2 වැනි සැතපුම තැනීම.

**ලියාපදිංචි විය යුතු මුදල**—රු. 65,000.

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ කොන්ත්‍රාත්කරුවන්ට 1969 මාර්තු මස 31 වැනි දින පස්වරු 2 තෙක් බදුල්ල කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ අදාල වැඩය වෙනුවෙන් රුපියල් 100ක මුදලක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම් තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණකර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1969 අප්‍රේල් මස 4 වැනි දින පස්වරු 2.30ට ඉහත කී අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 14ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියා පදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාර ගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බැව් දැන්වීම ටෙන්ඩර් කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගුවීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟවෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපිලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ල දිසාපතිගෙන් දැනගත හැකිය.

බයන් පර්ඩිනන්ඩ්ස්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1969 ජනවාරි මස 12 වැනි දින.

3–528—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මන්නාරම උප කොටස

මන්නාරම් උපකොටසට අයත් පහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර් පත් 1969 මාර්තු මස 28 වෙනි දින පෙරවරු 10 දක්වා උතුරු කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර විවෘත කිරීම එදිනට සිදු කරනු ලැබේ.

| සේවාව | අවැසි ලියා පදිංචිය | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| | රු. | | රු. |
| මන්නාරම් උපකොටසේ අකති ඇලේ අතිරේක ප්‍රධාන සොරොව්වක් නිර්මානය කිරීම | 28,000 | ... | 50 |

2. ඉහත සඳහන් මුදලට හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ ලාංකික වන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සංගම්වලට සහ ග්‍රාමසංවර්ධන සංගම් වලට පමණක් මෙම වැඩය සඳහා ඉල්ලුම් කළ හැක.

3. 1969 මාර්තු මස 24 වැනි දින පස්වරු 3.00 දක්වා එදිනද ඇතුළුව කායයීාලීය වේලාවන් තුළදී මන්නාරම, යාපනය, මුලතිව් සහ වව්නිකුලම් යන වාරිමාර්ග ඉංජිනේරු කායයීාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම වල පමණක් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ

ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද ? නැද්ද ? යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කලයුතුය.

පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම මෙම වැඩය සඳහා ඉහතසඳහන් ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාීලයේ හෝ කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

4. ග්‍රාම සංවර්ධන සංගම් හා සමුපකාර සංගම් ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීම අවැසි නොවේ. මෙම වැඩය සඳහා වැඩි විස්තර කායාීලීය වේලාවන් තුලදී මන්නාරමේ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

කේ. සිවසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මන්නාරම උ. කො.

මුරුන්කන්, 1969.3.1 දින.

3–397—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කල්මුනේ උප කොට්ඨාශය

කල්මුනේ උප කොට්ඨාශයේ කරවාකු කුඹුරු—දිය බැස්සවීමේ පහසුකම් සඳහා ටෙන්ඩර් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000 කට හෝ ඊට වැඩි ගනන් වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන්, ග්‍රාම සංවර්ධන සහ සමුපකාර සමිති වලින් මඩකලපුවේ නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 මාර්තු මස 28 වන සිකුරාදා දින පෙරවරු 10 වන තෙක් භාරගෙන එදිනම පෙරවරු 10.05 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

2. 1969 මාර්තු මස 24 වන සඳුදා දින දවල් 12 ග දක්වා අම්පාර, වෙන්කලඩි සහ කල්මුනේ යන වාරිමාර්ග කායාීල වලින් ලබාගත හැකි පෝරම් වල මෙම ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පත් අයදුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත් කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීම සඳහා ඉඩ දිය යුතු ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම් නිකුත් කිරීමට ප්‍රථමයෙන් යථෝක්ත වැඩය සඳහා රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තබා එවැනි තැන්පත් මුදලක් තබා ඇති බවට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. සියළු වැඩිමනත් විස්තර කායාීල වේලාවන් තු දී කල්මුනේ වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් එම කායාීලයේ දී ලබා ගත හැක.

සී. ෂන්මුගරාජ්,
උප කොට්ඨාශ නිලධාරි තැන,
කල්මුනේ උප කොටස.

වාරිමාර්ග කායාීලය,
කල්මුනේ.
1969. 3. 1 වන දින.

3–467—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

පී ඩී 3

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පොලොන්නරුව උප කොටස

ස්ථිර ඕවර්සියර් නිවාසයක් ඉදිකිරීම සඳහා පොලොන්නරුව ඊසාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 අප්‍රේල් මස 4 වෙනි දින පෙරවරු 10 වන තෙක් ටැන්ඩර් භාරගනු ලැබේ.

2. රුපියල් විසිපන්දාහකට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචියක් මෙම දෙපාර්තමේන්තුවේ ඇති විවිධ සේවා සමුපකාර සමිති සහ වෙනත් රජය පිළිගත් සමිති වලට මෙම සේවාව සඳහා ටැන්ඩර් ඉදිරිපත් කල හැක. ලියාපදිංචි සමිති වෙනුවෙන් ටැන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය.

3. 1969 අප්‍රේල් මස 1 වෙනි දින කාර්යාල වේලාවන් ඇතුළත පොලොන්නරු, කවුඩුල්ල, මින්නේරිය යන ස්ථානවල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ටැන්ඩර් අයදුම්පත් ලබා ගත හැක. දෙපිටපතකින් යුක්තව මෙය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි රැකෝඩ් පොත සහ දැනට කරන වැඩ සහ ඒවායේ ප්‍රගතිය දැක්වන ප්‍රකාශනයක් වාරිමාර්ග ඉංජිනේරු වෙත ටැන්ඩර් පෝර්ම ලැබිය යුතුද නැද්ද සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම සේවාව සඳහා ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25 ක වාරිමාර්ග අධ්‍යක්ෂකගේ නමින් ලබාගත් මුදල් ඇනවුම කින් හෝ කොළඹ හැර ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගන්නා ලද රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුයි.

5. වැඩි විස්තර සඳහා පොලොන්නරුව වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැක.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
පොලොන්නරුව උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
පොලොන්නරුව,
1969. 3. 5.

3–468—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගම්පහ උප කොටස

ගම්පහ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් 1969 අප්‍රියෙල් මස 5 වෙනි සෙනසුරාදා දහවල් 11.00 දක්වා ජාවත්ත පාරේ කොළඹ 5, බස්නාහිර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියෙන් දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කල හැක.

| වැඩෙහි නම | | ලියාපදිංචි වී තිබිය යුතු මුදල | | | ටෙන්ඩර් තැන්පත් මුදල | |
|---|---|---|---|---|---|---|
| | | රු. | ශ. | | රු. | ශ. |
| අළුත් ඇල ගල්වාන අමුණ හා හන්දිරම් ඇලේ පාලම තැනීම | ... ... ... | 90,000 | 0 | ... | 100 | 0 |

3. 1969 මාර්තු මස 14 වන දින සිට 1969 මාර්තු මස 28 වෙනි දින දහවල් 12.00 දක්වා කායාීලීය වේලාවන් තුලදී ගම්පහ/කළුතර/රත්නපුර/කොළඹ වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කායාීලයන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස්කල යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරණ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශණයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුයි.

4. තවද ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 100.00 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කායාීලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

5. මේ ටෙන්ඩර් ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කායාීලීය වේලාවන් තුලදී ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ජේ. පරමදාස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, ගම්පහ උප කොටස.

1969 මාර්තු මස 1 වැනි දින,
වාරිමාර්ග කායාීලය, ගම්පහ.

3–463—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## පුත්තලම උප කොට්ඨාශය

විෂය (1).—" කරුකුමඩුව් වැවට පිවිසෙන මාවත සෑදීම "

මේ වෙනුවෙන් 1969.2.21 දින දරණ රජයේ ගැසට් නිවේදනයේ පළ කළ නිවේදනය අවලංගුසේ සලකන්නේ නම් මැනවි.

ක. මු. සුබ්‍රමානියන්,
වාරි/ඉ., පුත්තලම උ. කො.

3-540—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### අනුරාධපුර උප කොටස

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහල අච්චිකුලම වැව් වැඩි දියුණු කිරීම සඳහා අනුරාධපුර උතුරු මැද කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969.4.11 වෙනි සිකුරාදා පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 18,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1969.4.7 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාල වේලාවන් තුලදී අනුරාධපුර/මහකනදරාව/පදවිය/රාජාංගනය යන වාරිමාර්ග කාර්යාල වලින් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩය සඳහා රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුළදී අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එස්. සභාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අනුරාධපුර උප කොටස.

3-553—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාතර්මේන්තුවට අයත් කොළඹ 8, සර්පන්ටයින් පාරේ මූළුතැන්ගෙය, ලිපිද්‍රව්‍ය ගබඩාව, කොළඹ 5, නාරාහේන්පිට විං කිරීමේ කම්හල, විංකෑම ගබඩාව සහ කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ ප්‍රවාහන ශාඛාව යන ස්ථානවල ඇති පාවිච්චි කළ බඩුබාහිරාදිය මිළදී ඉවත් කරගෙන යාම සඳහා කොළඹ 1, වැනම්විදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අප්‍රේල් මස 7 දින අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කොට 1969 .4.7 දින දවල් 12 දක්වා අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

විකිණීමට ඇති ද්‍රව්‍ය පිළිබඳ විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කායර්ාලයෙන් ලබාගත හැක.

අ. වි. ර. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.3.7 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

3-283—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### තිරුවාන ගල් සැපයීම

අප කම්හල්වලට පිරිසිදු තිරුවාන ගල් සැපයීම සඳහා ඉදිරිපත් කරනු ලබන සීල් තැබූ ටෙන්ඩර්පත් සංස්ථාවේ සාමාන්‍යාධිකාරී තැන විසින් 1969 මාර්තු 24 වෙනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

පහත සඳහන් පරිදි, මුදල් තැන්පත් කොට ටෙන්ඩර් ලියකියවිලි 1969 මාර්තු මස 22 වෙනි දින දහවල් 12 දක්වා ලබාගත හැක.

ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් 100.
ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රුපියල් 10.

සැපයීම් නිලධාරී.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් හා වාප්පු අංශය,
අංක 55, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.

3-615—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග කර්මාන්ත සඳහා ටැන්ඩර් කැඳවීම

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිතිවලින් මාතර දිස්ත්‍රික්කයේ පහත සඳහන් සුළු වාරිමාර්ග කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### ගම් වගා නිලධාරි කොට්ඨාශය—මාතර II

1. ඉරිකොන්ද අමුණ සෑදීම — පොල්ගහමුල්ල ගොවි කාරක සභා ප්‍රදේශය
2. කදුරුගස් ඇල ප්‍රතිසංස්කරණය — ගොඩගම ගොවි කාරක සභා ප්‍රදේශය
3. කෝන්ගහ ඇල ප්‍රතිසංස්කරණය — ගොඩගම ගොවි කාරක සභා ප්‍රදේශය
4. සියඹලාගහ ඇල ප්‍රතිසංස්කරණය — නාවිමන ගොවි කාරක සභා ප්‍රදේශය
5. මංවැල්ල ඇල ප්‍රතිසංස්කරණය — ගොඩගම ගොවි කාරක සභා ප්‍රදේශය
6. කිඹුලාපත්ත ඇල — හිත්තටිය ගොවි කාරක සභා ප්‍රදේශය

### ගම් වගා නිලධාරි කොට්ඨාශය—තිබ්බොටුවාව

7. හීන් ඇල සහ වේලි — හෝන්දුව පියැද්ද ගොවි කාරක සභා ප්‍රදේශය
8. කලාදඹිවිටි පහල හල් වේල්ල ඇල — කහදූගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය

### ගම් වගා නිලධාරි කොට්ඨාශය—වැලිගම

9. මහදිවෙල අමුණ අලුත්වැඩියා කිරීම — මාලිම්බඩ උතුර ගොවි කාරක සභා ප්‍රදේශ
10. කොටුවැද්දුගොඩ දෙනිය අමුණ සෑදීම — හල්ලල කොක්මාදුව ගොවි කාරක සභා ප්‍රදේශ
11. දම්මුල්ල අමුණ තැනීම — පෝරඹ කනංකෙ ගොවි කාරක සභා ප්‍රදේශය
12. ලාහුගොඩ අමුණ අලුත්වැඩියා කිරීම — වාහල කනංකෙ ගොවි කාරක සභා ප්‍රදේශය

ගම් වගා නිල්ධාරි කොට්ඨාශය—කිහගොඩ

13. ඉද්දගහ කුඹුර අමුණ — උඩුව බටහිර ගොවි කාරක සභා ප්‍රදේශය
14. දොම්මනයායේ අමුණ — නාරංගල ගොවි කාරක සභා ප්‍රදේශය
15. දඹකොලේ සිට දිද්දුව දක්වා ඇල — කැන්දපොල ගොවි කාරක සභා ප්‍රදේශය

ගම් වගා නිලධාරී කොට්ඨාශය—ඌරු බොක්ක

16. බදුඅතේ අමුණ අලුත්වැඩියා කිරීම සහ ඇල කැපීම — පස්ගොඩ ගොවි කාරක සභා ප්‍රදේශය
17. කරයල් දොල යායේ ඇල — කිරිපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය
18. ගම්මැදියාය-නුගේගොඩ දෙනිය ඇල ගල් අස්කිරීම — ඌරුබොක්ක ගොවි කාරක සභා ප්‍රදේශය
19. කන්දෙකුඹුර උඩහපැතිබැම්ම — කැටවල කන්දෙකුඹුර ගොවි කාරක සභා ප්‍රදේශය
20. මිනීපිටිය ඇල ප්‍රතිසංස්කරණය — බෙංගමුව ගොවි කාරක සභා ප්‍රදේශය
21. හුන්නංගෙවෙලේ පැතිබැම්ම — දම්පහල ගොවි කාරක සභා ප්‍රදේශය
22. හැම්බැව දොල ප්‍රතිසංස්කරණය — බෙංගමුව ගොවි කාරක සභා ප්‍රදේශය
23. ගංඉවුර සෑදීම — බෙංගමුව ගොවි කාරක සභා ප්‍රදේශය
24. සහල කීරිපිටියායේ ඇල සුද්ධ කිරීම — කීරිපිටිය ගොවි කාරක සභා ප්‍රදේශය

ගම් වගා නිලධාරි කොට්ඨාශය—දෙයියන්දර

25. දූන්දේ අමුණ — බමුණුගම රදවෙල ගොවි කාරක සභා ප්‍රදේශය

2. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පිටපත් දෙකකින් විය යුතුය. ඒවා ඉදිරිපත් කළහැක්කේ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවලය. එක එක කර්මාන්තය සඳහා පිටපත් දෙකකින් යුතු ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතු ය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නො කරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් ම එකඟ නොවන කිසි ම ටෙන්ඩරයක් සළකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1969.3.28 දින දවල් 12.30 දක්වා මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ය. කච්චේරියේ රුපියල් දහයක් (රු. 10) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර් කරු විසින් ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන් ම වචනවලින් ද දක්විය යුතු ය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලව නිවැරදි විය යුතු අතර, දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ හැම එකාක්ම ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට දින යොද සීල් තබන ලද ලියුම් කවරවල බහා, මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ '' ......... සුළු වාරිමාර්ග කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1969.4.3 දින දවල් 12ට හෝ ඊට පෙර මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති '' ටෙන්ඩර් පෙට්ටියට '' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ ටෙන්ඩර් භාර ගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම් දීම නිකුත් කළ දින සිට දින දහයක් ඇතුලත දී ටෙන්ඩර්කරු විසින් මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටු දයක ලෙස වැඩ නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට දහයක් ටෙන්ඩර් කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියලුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුවද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නාම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නො දන්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර්පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නො පැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුලත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධවන කවරකු සමඟ හෝ ගිවිසුමකට නො බැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළ දී සැලැසුම් පරීක්ෂා කර බැලීමට මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නො කිරීම නිසා, ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නො කියනු ඇත. යෝජිත ස්ථානයත් සැළැසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩ විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුල දී මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වනුයේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ආණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ගිවිසුමකට ඇතුලත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙනුයේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි නැතය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියෙකු විසින් 1969.4.5 දින පෙරවරු 10ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ගේ දනගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන් ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් හෝ නො කරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවෙකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රයේ අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන් ගේ සියලුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තිබිය යුතු ය.

කේ. ඒ. පෙරේරා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය,

මාතර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 මාර්තු මස 1 වැනි දින දීය.

3–381—69.3.14 දන අංක 14,845 දරන ගැසට් පත්‍රය

පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත් රිජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම භාරදිය යුතුයි. රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත් ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4ක් ඇතුළත නො ලැබුණේ නම් ඒ ගැන මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගෙන් වහාම විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ඉහත සඳහන් ටෙන්ඩර් බාරගැනීම නැවත්වීමට නියමිත වේලාවේදී මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ඇත.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති හෝ කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

7. ටෙන්ඩර් කරුවන් විසින් තම ලිපිනය නිවැරදිව පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවා වූ ද, දේවල මුළු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ නමින් තැන්පත් කිරීමට හා පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකළහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත.

9. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරණු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙණ ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්තුකරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟවෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේයැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුඩත්වය පළකරන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. වැඩි විස්තර මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාල යෙන් හා මාපලාන හෝ ලබුදූව රජයේ ගොවිපල කළමනාකරුගෙන් ද දැනගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘ.අ. හා ගො.).

1969.3.1 දින,
පේරාදෙණියේදීය.

3-391—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| කර්මාන්තයේ නම | ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශය |
|---|---|
| 1. කුඩාවැව වැව දියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 2. මිනිවැව වැඩිදියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 3. ගන්දරවැව වැඩිදියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 4. තිල්ලවල-ලුනුවිල ඇල වැඩි දියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 5. පිංවල මුල්වක්කඩ ඇල දියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 6. වී හේන්යාය බැම්ම දියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 7. ගෝනවිල බෝලවත්ත ඇල දියුණු කිරීම | දකුණු පිටිගල් කෝරලය |
| 8. පහළ ගලවැව වැඩිදියුණු කිරීම | රාජවන්නි පළාත |
| 9. කුඹුක්කැව වැව වැඩිදියුණු කිරීම | රාජවන්නි පළාත |
| 10. හල්මිල්ලෑව වැව වැඩිදියුණු කිරීම | රාජවන්නි පළාත |
| 11. දන්ගහවැව වැව වැඩිදියුණු කිරීම | රාජවන්නි පළාත |
| 12. පේත්තුකුලම වැව වැඩිදියුණු කිරීම | කුමාර වන්නි පළාත |
| 13. වට්ටක්කන්දල් වැව වැඩි දියුණු කිරීම | පුත්තලම් පත්තු හා කඩවත් |
| 14. සින්නකුලම වැව වැඩිදියුණු කිරීම | පුත්තලම් පත්තු හා කඩවත් |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 මාර්තු මස 25 දින දවල් 12 දක්වා හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

(18) උඩදුම්බර—ඞී. 34 ඇලේ 2 වෙනි අතුරු ඇල හොරොව්ව බැඳීම.

(19) උඩදුම්බර—වේරගම ඞී. 41 ඇල ප්‍රතිසංස්කරණය.

(20) උඩපළාත—පුස්සැල්ලාව දුනුකේවල කොස්ගොල්ල අමුණ නඩත්තුව.

(21) උඩපළාත—පුස්සැල්ලාව එගොඩකුඹුරේ ඇල අළුත්වැඩියාව.

(22) උඩබුලත්ගම—අඹගමුව කහවතුර ඔයේ අමුණ සහ ඇල වැඩිදියුණු කිරීම.

(23) උඩබුලත්ගම—කඳුරේගොඩ මැද ඇල වැඩිදියුණු කිරීම.

(24) උඩබුලත්ගම—අඹගමුව මැදවෙල්යායේ අමුණ වැඩිදියුණු කිරීම.

(25) උඩබුලත්ගම—රඹුක්පිටිය මලපැලගොඩ අමුණ වැඩිදියුණු කිරීම.

(26) උඩබුලත්ගම—කරහඳුන්ගල කෙලිහැදි මෝදර අමුණ වැඩිදියුණු කිරීම.

(27) පාතහේවාහැට—බෝපිටිය අතුරු ඇල අළුත්වැඩියා කිරීම.

(28) පාතහේවාහැට—ගොඩමුන්න මන්නාම්නිය ඇල වැඩිදියුණු කිරීම.

(29) පාතහේවාහැට—ලේවැල්ලේ කිරිමැටි ඇලේ කඩාබුව බැඳීම.

(30) මැදදුම්බර—පොද්දල්ගොඩ හක්කල ඇල අළුත්වැඩියාව.

(31) මැදදුම්බර—ගලබොඩවත්ත ගඟ අමුණ තැනීම.

(32) මැදදුම්බර—මිරිස්හේන ඇල වැඩිදියුණු කිරීම.

(33) මැදදුම්බර—කුඹලඔළුවේ උඩවෙලේ අමුණ තැනීම.

(34) මැදදුම්බර—නමදගල උඩ ඇල අළුත්වැඩියාව.

(35) මැදදුම්බර—උඩවෙල ඇල අළුත්වැඩියාව.

(36) මැදදුම්බර—මකුල්දෙනිය ලියන්ගහයට අමුණ තැනීම.

(37) යටිනුවර—බලන තොටපොල දෙනියවෙල්යායේ වේල්ල බැඳීම.

(38) යටිනුවර—ඉළුක්වත්තේකුඹුරේ ඇල සකස් කිරීම.

(39) උඩුනුවර—පල්ලේ අළුදෙනිය ගොඩපැලේ මානාවාරියට ජල පහසුකම්.

(40) උඩුනුවර—ගල්කොහොදෙනියේ කුඹුරේ ඇල වැඩිදියුණු කිරීම.

(41) හාරිස්පත්තුව—හිඟුල්වෙල දිවෙල්වෙල ඇල තැනීම.

(42) හාරිස්පත්තුව—අංකුඹුරනිල්ලේ කොස්ගහමුල ඇල තැනීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 මාර්තු මස 31 දින දවල් 12 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත්කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන්කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්ත කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර. 1969 අප්‍රේල් මස 3 දින පෙ. ව. 9.30 ට පෙර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මහනුවර දිස්ත්‍රික්කයෙ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරීතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලයීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අප්‍රේල් මස 3 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඞී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 මාර්තු මස 2 දින දීය.

3-561—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැල්සුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු නොලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ''ගොවිජන සේවා සහකාර කොමසාරිස්'' යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියකු විසින් 1969 මාර්තු මස 29 දින පෙ.ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඊ. ඇස්. ගුනතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 මාර්තු මස 4 දින දීය.

3–466—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### නාරංගේන් පිට නේවාසික ගොඩනැගිල්ලක් තැනීම

නාරංගේන් පිට නේවාසික ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් 1969 මාර්තු 31 වෙනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457, දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබා ගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 30,000කට ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කළ විට 1969 මාර්තු 22 වෙනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 මාර්තු මස 5 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ, අංක 457, දරණ
ස්ථානයේ පිහිටි සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දී ය.

3–488—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහළ ගිරිබාවා රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම හා ස්ථාපනය කිරීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 69.4.25 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.4.23 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතකුත් සමඟ ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලු ටෙන්ඩර් කවරයන් හි වම්පස ඉහළ කෙළවරේ ''පහළ ගිරිබාව රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලින් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබගාත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන් ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 30ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස් වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තකවනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.4.25 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

සී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
1969.3.6
සිපී/2/363

3–543—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 හි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපතිතුමා විසින් පහත සඳහන් සිවිල් ඉංජිනේරු වැඩ සඳහා මුද්‍රා තබා වෙන් වශයෙන් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1969 අප්‍රේල් මස 3 වෙනි බදාදා පූ. භා. 10 වන තෙක් භාර ගනු ලැබේ:—

(1) නුවර දක්ෂිණ (2) මාතර

ඉංජිනේරු ගොඩනැගිලි ඉදිකිරීම බස් නැවතුම්පොළේ අංගන සහ පාරවල් ඉදිකිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ අවශ්‍ය අනෙකුත් විස්තර සහ තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂාකර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාතර්මේන්තුවල රු. 50,000ට අධිකව වැය වන කර්මාන්තයන් සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් අංක 1 දරණ කර්මාන්තය සඳහා රු. 35,000ක් හෝ එයට අධිකව වැය වන කර්මාන්තයන් සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් අංක 2 දරණ කර්මාන්තය සඳහාද ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත් කරුවන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරුතැන විසින් පරීක්ෂා කොට අනුමත කළහොත් පමණක් අංක 1 සහ 2 යන කර්මාන්තයන් වෙනුවෙන් රු. 100 බැගින් වූ ටෙන්ඩර් ඇප මුදල් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන රිසිට් පත ප්‍රධාන සිවිල් ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ විට 1969 මාර්තු 29 වෙනි සෙනසුරාදා මධ්‍යහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

200, කිරුළ පාර,
කොළඹ 5, 7.2.69.

ප්‍රධාන සිවිල් ඉංජිනේරුතැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

3–491—69.3.14 දන අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය —රත්මලාන

### අම්පාරේ ජලසම්පාදන යෝජනා ක්‍රමය (1 වෙනි පියවර)

අම්පාරේ ජලසම්පාදන යෝජනා ක්‍රමයේ—පළමුවෙනි පියවරහි පවිත්‍ර කිරීමේ යන්ත්‍රයට උපකරණ සැපයීම හා සවිකිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, යෝර්ක් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ 75 1/1 අංක දරන පළාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෂී 1969 ක්වූ ජූනි මස 17 වෙනි අඟහරුවාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර මගින් පිටපත් 2කින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධවූ සියලු විස්තර හා තොරතුරු ද ඉහතකී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවන අතර මෙයට අදාල සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලාගත හැකි වන්නේය.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ 'ඒ' හෝ 'බී' කාණ්ඩයේ ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් හෝ 'ඒ' හෝ 'බී' කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්ද පමණක් පහත සඳහන් ලියකියවිලි 1969 අප්‍රේල් මස 22 වෙනි දින දහවල් 12ට පෙරාතුව ඉහතකී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේය.

(අ) ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි හා

(ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් දෙසිය පනහක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා, යෝජිත වැඩය භාර ගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරින් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත්, සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කාර්යාලය හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කල හැකිය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන
අංශයේ වැඩ බලන අධ්‍යක්ෂ.

පළාත් පාලන අමාත්‍යාංශයේ
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන. 1969 ක්වූ මාර්තු මස 6 වෙනි දින දීය.

3–596—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වන සත්ව දෙපාර්තමේන්තුව

පහත සඳහන් සේවාවන් දෙක සඳහා සීල් කර එවන ටෙන්ඩර් පත්‍ර, කොළඹ 1, ඇචිලන් චතුරශ්‍රයේ වන සත්ව දෙපාර්තමේන්තුවේ වන සත්ව භාරකාර විසින් 1969.4.18 වැනි දින දහවල් 12 දක්වා භාර ගනු ලැබේ:—

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල්-පානම මාර්ගයේ පානම හි දඩයම් රැකවල් හා දඩයම් මුරකරු නිවාසයක් තැනීම.

(ආ) අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල්-ඕකන්ද මාර්ගයේ ඕකන්ද හි දඩයම් රැකවල් හා දඩයම් මුරකරු නිවාසයක් තැනීම.

2. එක් එක් සේවාව සම්බන්ධයෙන් මිල ගණන් වෙන වෙනම සඳහන් කර වෙනම කවරයක එවිය යුතුයි.

3. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම 1969.4.11 වැනි දින පස්වරු 2.30 දක්වා ආපසු ගත හැකි රු. 50 ක ටෙන්ඩර් පත් මුදලක් ගෙවීමෙන් ලබා ගත හැක. මෙම මුදල එක් සේවාවක් සඳහා පමණි.

4. මෙම එක් එක් සේවාව සඳහා එවන ටෙන්ඩර් බහා ඇති කවරයේ උඩ වම් පස කෙළවරේ කුමන සේවාව සඳහා ද කියා සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැක.

5. ගොඩනැගිල්ලේ නිර්මාණය හා අයපත්‍ර මෙම කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළදී 1969.4.10 වැනි දින දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

6. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් පෝර්මයේ සඳහන් කර ඇත.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
වැඩ බලන වන සත්ව භාරකාර.

1969. 3. 6 වන දින,
කොළඹ 1,
වන සත්ව දෙපාර්තමේන්තුවේ දී ය.

3–597—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## පෑලියගොඩ නගර සභාව

මෙහි පහත විස්තර ඇති කර්මාන්ත සඳහා 1969 ක්වූ මාර්තු මස 27 දින උදේ 9.30 දක්වා, පෑලියගොඩ නගර සභාවේ සභාපතිවරයා විසින් සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

1. ටැන්ඩර් පත්‍ර ඉහත සඳහන් වේලාවට හෝ ඊට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමට සැලැස්විය යුතුයි. ටැන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුයි.

2. වැඩ ලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා රු. 250 ක මුදලක් ඇපය වශයෙන් තැන්පත් කර, ටැන්ඩර් ෆෝර්මයේ මුදල වන රු. 25 ක් ද ගෙවා, ලබාගන්නා ෆෝර්මවල පමණක් ගණන් සඳහන් කර එවිය යුතුයි. ඇප මුදල වන රු. 250 ආපසු ගෙවන අතර, ටැන්ඩර් ෆෝර්මයේ ගාස්තුව වන රු. 25 ආපසු ගෙවනු නොලැබේ.

3. ටැන්ඩර් පත්‍රවල ඉලක්කම් ආදිය යම් කිසි ක්‍රමයකින් වෙනස් කර තිබේ නම්, එම ස්ථානවල ටැන්ඩර්කරුගේ අත්සන තැබිය යුතුය.

4. ටැන්ඩර් පත්‍ර භාරගත් බව දැනුම් දී සති දෙකක් ඉකුත්වීමට පෙර ගිවිසුම් පත්‍රයකට අත්සන් නොතැබුවහොත්, තැන්පත් මුදල ආපසු දෙනු නොලැබේ.

5. 1969.3.24 වැනි දින දහවල් 12 න් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

6. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ බලය සභාපතිවරයා සතුය.

7. වැඩි විස්තර කාර්යාලයේ රාජකාරි කරන වේලාවන්හිදී කර්මාන්ත පරීක්ෂකතැනගෙන් දැනගත හැකිය.

8. ටැන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරන්නේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ පළාත් පාලන ආයතනවල හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල රු. 2,00,000 ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටය. ටැන්ඩර් ෆෝර්ම ලබාගැනීමට පෙර ලියාපදිංචි ඇති පොත මෙම කාර්යාලයට පෙන්විය යුතුය.

1. මුඩුක්කු සංහාරක නිවාස යෝජනා ක්‍රමය යටතේ ජෝඩු නිවාස 8 ක් සෑදීම.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ
සභාපති.

1969. 2. 28 වැනි දින,
පෑලියගොඩ නගර සභා කාර්යාලයේ දීය.

3–611—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### නුවර සහ මාතලේ දිස්ත්‍රික්කවලට අයත් හුලංකන්ද-කලුපාන පාර තැනීම සඳහා ටෙන්ඩර්

හුලංකන්ද-කලුපාන පාර තැනීම සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969.4.3 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1969.4.1 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක, අනුපිටපතකුත් සමග, ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත්, තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "හුලංකන්ද-කලුපාන පාර තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට හය මසක් ඇතුළත වැඩය නිමකළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.4.3 දින පෙ. ව. 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ අඩුම වශයෙන් රු. 2,50,000 කට රෙජිස්ටර් වූවන් විය යුතු අතර ටෙන්ඩර් පත් ලබා ගැනීමේ දී එම රෙජිස්ටර්වීම ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දේවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් බාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීවී/1/442
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ, 69.3.6.

3–579—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

69.4.1 සිට 70.3.31 කාලය තුල අධිකාරි ඉංජිනේරුවරුන්ගේ ප්‍රධාන නිර්මාන ඉංජිනේරුතැනගේ (ගොඩනැගිලි) සහ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගේ ප්‍රදේශවල ඇති හිස් තාර පීප්ප, හිස් වානේ පීප්ප සහ හිස් සිමෙන්ති උර මිලයට ගැනීම සහ ඉවත් කිරීම සඳහා වූ ගැණුම්පත්, ඒ ඒ ප්‍රාදේශීය ගැණුම්පත් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1969 මාර්තු මස 30 වන ඉරිදා පෙරවරු 11 වන තෙක් ඔවුන්ගේ කාර්යාලවලදී බාර ගනු ලැබේ. 1969 මාර්තු මස 30 වැනි ඉරිදා පෙරවරු 11.05 ට ඒ ඒ ප්‍රාදේශීය ගැණුම්පත් මණ්ඩලවල සභාපතිවරයා විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ ගැණුම් පත් විවෘත කරනු ලබන අතර, ගැණුම්පත් කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම ගැණුම්පත් විවෘත කරනු අවස්ථාවේදී පෙනී සිටිය හැක.

2. ඒ ඒ ගැණුම්පත් මණ්ඩලවල සභාපතිවරුන්වන මෙහි පහත දැක්වෙන් අධිකාරි ඉංජිනේරුවරුන්, ප්‍රධාන නිර්මාන ඉංජිනේරු (ගොඩනැගිලි) සහ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ගැණුම්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔවුන්ගෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් තැන්පත් මුදලවන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් වෂී 1969 මාර්තු මස 24 වැනි සඳුදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කල විට මෙහි පහත සඳහන් අධිකාරි ඉංජිනේරුවරුන්, ප්‍රධාන නිර්මාන ඉංජිනේරු (ගොඩනැගිලි) සහ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන විසින්, ඔවුන්ගේ ප්‍රදේශවල තිබෙන හිස් තාර පීප්ප, හිස් වානේ පීප්ප සහ හිස් සිමෙන්ති උර ඉවනුවෙන්, ඉල්ලුම් කරුවන්වෙත ටෙන්ඩර් පත් නිකුත් කරනු

ලබනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායසීලයේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කල හැකිය.

ඇස්. සෙල්ලදොරේ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට

ර.වැ.දෙ. ප්‍රධාන කායසීලය,
කොළඹ 1,
1969.3.7

තම තමන්ගේ ප්‍රදේශවල දැක්වෙන හිස් භාජන වෙනුවෙන් ගැණුම්පත් භාරගනු ලබන ප්‍රාදේශීය ගැණුම්පත් මණ්ඩලවල සභාපතිවරුන්ගේ ලැයිස්තුව :—

1. අධිකාරි ඉංජිනේරු, බටහිර කොට්ඨාශය, ර. වැ. දෙ. කොළඹ 7.
2. අධිකාරි ඉංජිනේරු, මධ්‍යම කොට්ඨාශය, ර. වැ. දෙ. මහනුවර.
3. අධිකාරි ඉංජිනේරු, දකුණු කොට්ඨාශය, ර. වැ. දෙ. ගාල්ල.
4. අධිකාරි ඉංජිනේරු, සබරගමු කොට්ඨාශය, ර. වැ. දෙ. රත්නපුරය.
5. අධිකාරි ඉංජිනේරු, උතුරු කොට්ඨාශය, ර. වැ. දෙ. යාපනය.
6. අධිකාරි ඉංජිනේරු, වයඹ කොට්ඨාශය, ර. වැ. දෙ. කුරුණෑගල.
7. අධිකාරි ඉංජිනේරු, ඌව කොට්ඨාශය, ර. වැ. දෙ. බදුල්ල.
8. අධිකාරි ඉංජිනේරු, නැගෙනහිර කොට්ඨාශය, ර. වැ. දෙ. මඩකලපුව.
9. අධිකාරි ඉංජිනේරු, උතුරු මැද කොට්ඨාශය, ර. වැ. දෙ. අනුරාධපුරය.
10. ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු, (ගොඩනැගිලි) ර. වැ. දෙ. රත්මලාන.
11. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන, ර. වැ. දෙ. රත්මලාන.

3–578—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ශාලු වරායේ පිහිටි ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යෝජිත ආපන ශාලාව බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1969.3.28 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1969.3.24 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

3–575—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## කළුතර කච්චේරිය

### කළුතර දිස්ත්‍රික්කය තුළ තරුණ ගොවි ව්‍යාපාරවල හා උස්බිම් ව්‍යාපාරවල පාරවල් තැනීම

පහත සඳහන් වැඩ සඳහා රුපියල් විසි දහසකට (රු. 20,000) හෝ ඊට වැඩි තැනීම් වැඩ වෙනුවෙන් රජයේ වැඩ, අධ්‍යාපන හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිව ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති (රු. 20,000 සහ ඊට වැඩි වටිනාකම ඇති වැඩ සඳහා ඉහත සඳහන් දෙපාර්තමේන්තුවට ලියාපදිංචිව ඇති) වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) බදුරලිය—හැඩිගල්ල පාරේ පුවක්දොල හරහා පාලම තැනීම,
(2) වරතල්ගොඩ—කෙලින්කන්ද පාරේ 5 වැනි සැතපුමේ ගල් හා තාර දැමීම.

2. සියළුම ටෙන්ඩර් පත්‍ර එක් එක් වැඩය වෙනුවෙන් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට වෙන වෙනම කවරවල බහා සීල් තබා කළුතර, ආණ්ඩුවේ ඒජන්ත නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර් කළුතර කච්චේරියේ උප දිසාපති තුමාගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. නොඑසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ, වම් කෙළවරෙහි ඒ ඒ වැඩයේ නම ලියා 1969.3.31 වැනිදා පස්වරු 2.30 ට පෙර කළුතර ආණ්ඩුවේ ඒජන්ත වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ටද එම වේලාවේදී පැමිණ සිටිය හැකිය.

5. 1969.3.30 වැනි දින දවල් 12 දක්වා කළුතර දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය. නියමිත ෆෝර්මයේ ඉදිරිපත් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කටුගෑම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුයි.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර එක් එක් වැඩය වෙනුවෙන් රු. 20 බැගින් කළුතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාර ගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් හෝ ඒ දැන්වීම ටෙන්ඩර්කරුට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනෙක් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරා ගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස්ය.

11. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

13. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම්කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි හැඟියන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දැක්වූ විට කොන්ත්‍රාත්කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

14. කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද, මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වය අනුව එවකට සහ ඉන්පසු මෙහි නිලයෙහි අත්සන් කරන අයද අයත් වේ.

15. මෙයට පෙර භාර ගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල් වේලා ඇතිව ඔවුන් දැනට කරගෙන යන වැඩවල තත්ත්වය දැක්වෙන, එම වැඩ භාරව සිටින පරිපාලන නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල් තැන්පත් කොට ගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේ දී ඇපකරුවන් අවශ්‍ය වුවහොත්, තෝරා ගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමේ සමත් විය යුතුය.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවකට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත්කරුවෙක් වෙතොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969.3.1 වැනි දින,
කළුතර කච්චේරියේ දී ය.

3–385—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

5. 1969 අප්‍රේල් මස 4 වැනි දා පෙරවරු 10.30 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඞී. එස්. කළුගම්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 6 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

3–558—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 5 වැනි සෙනසුරාදා පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | මහ/සමන්එළිය මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 2. | නු/ගාමිණී මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 3. | මහ/සමන්එළිය මහා විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි |
| 4. | නු/ගාමිණී මහා විද්‍යාලය | ... | විද්‍යා රසායනාගාරය |
| 5. | නු/ශුද්ධ ත්‍රිත්ව මහා විද්‍යාලය | ... | විදුහල්පති නිවාසය |
| 6. | නු/හැඳුනුවැව මධ්‍ය මහා විද්‍යාලය | ... | වාණිජ විද්‍යා ගොඩනැගිල්ල |
| 7. | නු/ශ්‍රී පියතිස්ස විද්‍යාලය | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 8. | නු/ගාමිණී මහා විද්‍යාලය | ... | ගුරු නිවාසයේ ඉතිරි වැඩ |
| 9. | නු/ගාමිණී මහා විද්‍යාලය | ... | කෘෂිකර්ම විද්‍යාගාරය |
| 10. | බ/වැළිමඩ මධ්‍ය මහා විද්‍යාලය | ... | එම |
| 11. | බ/කැප්පිටිපොල මහා විද්‍යාලය | ... | මා. අ. නි. කාර්යාලය |
| 12. | නු/ශුද්ධ ත්‍රිත්ව මහා විද්‍යාලය | ... | වැසිකිළි |

### අංක 1.—සංලක්ෂාය

නු = නුවරඑළිය දිස්ත්‍රික්කය
මහ = මහනුවර දිස්ත්‍රික්කය
බ = බදුල්ල දිස්ත්‍රික්කය

### අංක 2.—අවශ්‍ය ලියාපදිංචි කිරීම

අංක 1 සඳහා පමණක් — රු. 45,000 ක් හෝ ඊට වැඩි
අංක 2 සඳහා පමණක් — රු. 40,000 ක් හෝ ඊට වැඩි
අංක 3 සහ 4 සඳහා — රු. 35,000 ක් හෝ ඊට වැඩි
අංක 5 සඳහා පමණක් — රු. 30,000 ක් හෝ ඊට වැඩි
අංක 6 සිට 8 දක්වා — රු. 25,000 ක් හෝ ඊට වැඩි
අංක 9 සහ 10 සඳහා — රු. 20,000 ක් හෝ ඊට වැඩි
අංක 11 සහ 12 සඳහා — රු. 5,000 ක් හෝ ඊට වැඩි

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ඉහත අංක 2 හි සඳහන් ගණනට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට 1969 අප්‍රේල් මස 3 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක මුදල්භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි අංකයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීමට අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. පූර්වෝක්ත 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපැලෙන් නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1969 අප්‍රේල් මස 5 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30 ට නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවනට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර්පත් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

පී. ඊ. ජී. මැන්දිස්,
නුවරඑළිය ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 මාර්තු මස 5 වැනි දින,
නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ දී.

3–469—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පාසැල්වලට "ඇදිහැස" කිරි විස්කෝතු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි—1968-69

වර්ෂ 1969 මැයි මස 1 වැනි දින සිට 1969 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ, 19″ × 11″ × 9″ ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටිවල ආසන්න වශයෙන් රාත්තල් 20 බැගින් අඩුරා ඇති කිරි විස්කෝතු පෙට්ටි ප්‍රවාහනය කිරීම සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1969 අප්‍රේල් මස 8 වැනි දින පෙරවරු 10 දක්වා රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි :—

(1) ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, රත්නපුර බෙදාහැරීමේ ගබඩාවේ සිට, කිරිඇල්ල, රත්නපුර, නිවිතිගල සහ කළුවාන අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලට.

(2) ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, ඕපනායක බෙදා හැරීමේ ගබඩාවේ සිට, බලන්ගොඩ උතුර සහ බලන්ගොඩ දකුණ අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලට.

3. ටෙන්ඩර් පත්‍ර රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතුය. රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 100 ක්

තැන්පත් කර ඊට රිසිට් පතක් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුවන්ට 1969 අප්‍රේල් මස 7 වැනි දින පස්වරු 2 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එක් එක් සේවාව සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කළ යුතුය. අනුමත කරන ලද සමිති විසින් මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය ය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාර දීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000 ට නොඅඩු වටිනාකමක් ඇති නිශ්චල දේපල ඇති බවට තම ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරීන්ගෙන් මෑතකදී ලබා ගත් සහතිකයක් ද, එක් එක් සේවාවන් සඳහා ඉල්ලුම්කරු නමින් ලියාපදිංචි කරන ලද මේ වර්ෂයට වලංගු බලපත්‍රය ඇති එක් ලොරියක්වත් ඇති බවට සාක්ෂි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු ය.

5. අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමූපකාර සමිති විසින් ටෙන්ඩර් පත් ලබා ගැනීමට පෙර එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට සමූපකාර සමිති රෙජිස්ත්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ (ඒ ඒ සමිතිවලට අදාල පරිදි) ලබා ගත් සහතිකයක් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමට හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට හෝ බලය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුය.

7. 1969 අප්‍රේල් මස 8 වැනි දින පෙරවරු 11 ට රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

8. මේ සම්බන්ධයෙන් තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත හැක.

එස්. පී. ජයසූරිය,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969.3.14 දා,
රත්නපුර,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

3–334—69.3.14 දින අංක 14,845 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අප්‍රේල් මස 7 වැනි සඳුදා ප. ව. 2.30 වන තෙක් මෙහි පහත වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. ර/ඉළුක්කුඹුර විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 2. ර/උඩගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 3. ර/කලවාන ගාමිණී මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 4. ර/උතුම්පුල්ලිගොඩ විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 5. ර/වැල්කෙණියාය විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි 2 තැනීම |
| 6. ර/වරායාය විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 7. ර/දෙනගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 8. ර/දොරපනේ විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළිය තැනීම |
| 9. ර/ඕබිලේගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 10. ර/මැදගීන්න විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 11. ර/ඇහැළියගොඩ මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 12. ර/වේවැල්කඳුර විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම |
| 13. ර/සුදුගල ශ්‍රී රාහුල විද්‍යාලය | ගුරු නිවාසය තැනීම |
| 14. ර/කිරිබත්ගල විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම |
| 15. ර/උතුරු හුණුවල විද්‍යාලය | ගුරු නිවාසය තැනීම |
| 16. ර/මැද්දේගම සිරි පියරතන විද්‍යාලය | ගුරු නිවාසය තැනීම |
| 17. ර/ඕමල්පේ විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම |
| 18. ර/වියලගොඩ විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම |
| 19. ර/කැවේපොල විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම |
| 20. ර/බුත්කන්ද විද්‍යාලය ... | ගුරු නිවාසය තැනීම |
| 21. ර/කොලොන්න මහා විද්‍යාලය | විද්‍යා රසායනාගාරය තැනීම |
| 22. ර/පලීගල විද්‍යාලය ... | ගුරු නිවාසය සහ පාසැල් ගොඩනැගිල්ල අළුත්වැඩියාව |
| 23. ර/ගැටනැත්ත අනුර විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල අළුත් වැඩියාව |
| 24. ර/වැද්දාගල දකුණ මහා විද්‍යාලය | ගොඩනැගිලි අළුත්වැඩියාව වැඩියාව |
| 25. ර/තිරිවානකැටිය විද්‍යාලය ... | ගුරු නිවාසය සහ පාසැල් ගොඩනැගිල්ල අළුත්වැඩියාව |
| 26. ර/ගබ්බෙල මහා විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල අළුත් වැඩියාව |
| 27. ර/පන්නිල විද්‍යාලය ... | ගුරු නිවාසය සහ පාසැල් ගොඩනැගිල්ල අළුත්වැඩියාව |
| 28. ර/කිරිඇල්ල මහා විද්‍යාලය... | විශාල අළුත්වැඩියාව |
| 29. ර/බඹරබොටුව විජේබාහු මහා විද්‍යාලය | විශාල අළුත්වැඩියාව |
| 30. ර/යටිපස්ගමුව විද්‍යාලය ... | වැසිකිළි 2 සහ ළිඳ තැනීම |
| 31. ර/නිවිතිගල සුමන මහා විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල වහල අළුත්වැඩියාව |
| 32. ර/බැරන්ඩුව විද්‍යාලය ... | විශාල අළුත්වැඩියාව |
| 33. ර/ශාන්ත ලූක් විද්‍යාලය ... | විශාල අළුත්වැඩියාව |
| 34. ර/විජේරිය සුමන මහා විද්‍යාලය | විශාල අළුත්වැඩියාව |
| 35. ර/බළංගොඩ බාලිකා විද්‍යාලය | අළුත්වැඩියාව සහ ජල නළ සේවය |
| 36. ර/ගන්ගන්ද මධ්‍ය මහා විද්‍යාලය ... | විශාල අළුත්වැඩියාව |
| 37. ර/පේරලන්ද විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල අළුත් වැඩියාව |
| 38. ර/නෙල්ලිවල විද්‍යාලය ... | විශාල අළුත්වැඩියාව |
| 39. ර/ගවරන්හේන විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 40. ර/හකමූව බෞද්ධ විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 41. ර/පැලවත්ත විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 42. ර/බුලත්ගම විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 43. ර/ගලගම මහා විද්‍යාලය ... | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 44. ර/ගොඩකවෙල රාහුල මහා විද්‍යාලය | විශාල අළුත්වැඩියාව |
| 45. ර/කුරුවිට මහා විද්‍යාලය ... | විශාල අළුත්වැඩියාව |

**සංලක්ෂය :** ර=රත්නපුර දිස්ත්‍රික්කය.

2. කොළඹ බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදල කට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අප්‍රේල් මස 3 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම්, ආදිය භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේදී කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

### අවශ්‍ය ලියාපදිංචි

අංක 1, 6, 12 සහ 31 වැඩ සඳහා රු. 10,000
අංක 2 වැඩය සඳහා රු. 20,000
අංක 3 වැඩය සඳහා රු. 15,000
අංක 4, 5, 8, 17 සහ 20 වැඩ සඳහා රු. 14,000

අංක 7 සහ 9 වැඩ සඳහා රු. 11,000

අංක 10 වැඩය සඳහා රු. 9,000

අංක 11 වැඩය සඳහා රු. 16,000

අංක 13, 14, 15, 16, 18, 19, 36 සහ 44 වැඩ සඳහා රු. 13,000

අංක 21 වැඩය සඳහා රු. 23,000

අංක 22, 23, 25, 26, 28, 30, 35, 37, 39, 40, 42 සහ 45 වැඩ සඳහා රු. 5,000

අංක 24 සහ 41 වැඩ සඳහා රු. 6,000

අංක 27, 29, 32 සහ 34 වැඩ සඳහා රු. 7,000

අංක 33, 38 සහ 43 වැඩ සඳහා රු. 8,000

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද මේ වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීමෙන් නිදහස්ය. ඔවුන් දෙවන ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂගෙන් ලබා ගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය පිළිබඳ විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1969 අප්‍රේල් මස 7 වෙනි දා ප. ව. 2.30 ට රත්නපුර දෙපාර්ත දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වනතුරු තමන් සඳහන් කරන මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එස්. පී. ජයසූරිය,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්ෂ.

1969 මාර්තු මස 1 දින,
රත්නපුර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

3–380—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1968-69 වර්ෂය සඳහා සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම

රජයේ පාසල්වලට අවශ්‍ය සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1969 අප්‍රේල් මස 10 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායඹිලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘතිපත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර 1969 අප්‍රේල් මස 7 වැනි දින පස්වරු 4.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කායඹිලයේ දී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "සංගීත භාණ්ඩ හා නැටුම් උපකරණ සැපයීම—1968-69 සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර පත්‍රය" යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර්පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කායඹිල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබදු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුගේ නාම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය).

6. ටෙන්ඩර ආකෘතිපත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

වී. කන්නන්ගර,
ගණකාධිකාරී, (සැපයීම්),
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථාවර
ලේකම් වෙනුවට.

1969 මාර්තු මස 6 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

3–590—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

යොමු අංක සීඩී/13/68.

## කොළඹ රෝහල් මණ්ඩලයේ ආයතනවල

## ඉඳුල් කෑම විකිණීම

1969.4.1 වන දින සිට 1969.9.30 වන දින දක්වා පුරා කාලය තුල මෙහි සඳහන්-උපලේඛනයේ දක්වෙන රෝහල් වල මුළුතැන් ගෙවල බැහැර ලන ඉඳුල් කෑම මිලදී ගෙන යෑම සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් ලාංකිකයින්ගෙන් හෝ ලාංකික ආයතන වලින් 1969 මාර්තු මස 28 වන දින පෙරවරු 10.30 වන තෙක් කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් ආයතනය (අංශය) සඳහා වෙන් වෙන් වශයෙන් මාසික මිල ගණන් සඳහන් කළ ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් එවිය යුතු අතර එය බහාලන කවරයේ වම් කෙළවරේ උඩ "ඉවත ලන ඉඳුල් කෑම විකිණීම" යනුවෙන් සඳහන් කළ යුතුය. කවරය තුල බහා සීල් තබන ලද සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ මා වෙත ලියා පදිංචි තැපැලෙන් එවීමෙන් 1969 මාර්තු මස 28 වන දින පෙරවරු 10.30 ට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. ඉදිරිපත් කරනු ලබන සෑම ටෙන්ඩර් පත්‍රයක්ම 69.3.28 වන දින පෙරවරු 10.30 ට කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී තැනගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

4. මේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති සියලුදෙනාටම පැමිණ සිටිය හැක. පැමිණ සිටින අයගේ දැන ගැනීම සඳහා නම් හා මිල ගණන් කියවනු ලැබේ.

5. තෝරාගනු ලබන ටෙන්ඩර් කරු මෙහි පහත උපලේඛනයේ දක්වෙන ආයතනයන්වල ඉඳුල් කෑම දිනපතා ඉවත ගෙන යන බවට හා එම සේවාවන් හරියාකාරව ඉටු කරන බවට ගිවිසුමකට බැඳිය යුතු අතර ඒ උපලේඛනයේ දක්වෙන පරිදි ඇපයක්ද තැබිය යුතුව ඇත. මේ ඇප මුදල කොන්ත්‍රාත්තුව අවසානයේදී කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

6. මේ ආයතනවල ඉවත ලන ඉඳුල් කෑම සඳහා කරනු ලබන මාසික ගෙවීම් ගාස්තු ඒ මාසයේ 1 වන සේවා දිනයේ දහවල් 12 ට පෙර ගෙවිය යුතුය.

7. මහ රෝහලේ ඉඳුල් කෑම කොටස් තුනකට බෙදා ඇත :

(1) මුළුතැන් ගෙවල ඉඳුල් කෑම.
(2) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල් කෑම ආදිය.
(3) කොළඹ හෙදි විදුහලේ මුළුතැන්ගෙවල ඉඳුල් කෑම යනාදි වශයෙන්.

8. මේ පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී.

1969 පෙබරවාරි 19 දින,
කො.රෝ. මණ්ඩලීය අධිකාරි කාර්යාලය,
කින්සිපාර, කොළඹ 8.

උපලේඛනය

| | ආයතනය | ඇප මුදල රු. |
|---|---|---|
| 1. | කාසල් වීථියේ කාන්තා රෝහල, කොළඹ ... ... | 50 |
| 2. | ද සොයිසා කාන්තා රෝහල, කොළඹ ... ... | 50 |
| 3. | ළමාරෝහල, කොළඹ ... ... ... | 50 |
| 4. | නයනා රෝහල, කොළඹ ... ... ... | 50 |
| 5. | මහ රෝහල—(1) මුළුතැන්ගෙවල ඉඳුල් ආහාර ... | 100 |
| | කොළඹ (2) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල් ආහාර ... | 100 |
| | (3) කොළඹ හෙදි විදුහලේ ඉවත ලන ඉඳුල් ආහාර | 50 |

3–331—69.3.14 දින අංක 14,845 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—රත්නපුර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 මැයි 1 වෙනි දින සිට 1969 සැප්තැම්බර් 30 දක්වා (දින දෙකම ඇතුලුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව. පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර රත්නපුර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍යසේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙම උපලේඛණයෙහි 2 වැනි තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචිකරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධසේවා සංගම්වලට අයිති සමිති වල්ටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල මඩකලපුව, කොළඹ, ගාල්ල යාපනය, කලුතර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, මහනුවර සහ වවුනියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කම් විස්තරය.**—සියලුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදීත් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදීත් ටෙන්ඩර් අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් 2 වන ඡෙදයේ (ii) වැනි කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛණයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, රත්නපුර '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන්කල යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචිකල තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛණයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි දී පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන්වූ වහාම මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේදී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කල හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛණයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුලු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයේ ''සී'' උපලේඛණයට වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරු විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවැනි ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන්කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛණයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුය.

11. **බඩුබාහිරාදිය කඩා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සලසාදෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරු විසින් සැළකිය යුතුය.

එස්. ජී. කුලතිලක,
රත්නපුර සෞඛ්‍ය සේවා අධිකාරි.

1969.2.28 වැනි දින,
රත්නපුර, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

## උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාලු | මස් | කරවල | එළවලු | නොගෙවන රෝගීන්ට: මාලු | මස් | කරවල | එළවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. ගිලීමලේ ගැමි රෝහල ... | 100 ... | 600 ... | 1969.4.10 දින උදේ 10 | — ... | 250... | 500... | 1,000... | — ... | 425... | 800... | 1,650 |

3–318—69.3.14 දින අංක 14,845 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ රෝහල් මණ්ඩලය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1969 මැයි 1 වැනි දින සිට 1970 අප්‍රේල් 30 වැනිදායින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන කාලය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයෙහි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී විසින් භාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු, මෙම කාර්යාලයෙන්ද ආයතනය භාර වෛද්‍ය නිලධාරිතැනගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන අමානම-ටෙන්ඩරයක් වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම්, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිළධාරියාට හෝ දැන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවටද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාත් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසා හෝ ඒ කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු, මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට, ගබඩා, විදුලි බලය, ජල ආදිය පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිළධාරීතුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු විෂබීජ නැති කිරීම සඳහා වෙනම ස්ථානයකට ගෙන යැමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යැමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

ඒ. නාගේන්ද්‍රන්,
කොළඹ රෝහල් මණ්ඩල අධිකාරී.

කො.රෝ.ම. අධිකාරී කාර්යාලය,
මහ රෝහල, කොළඹ,
1969 මාර්තු 1 වැනි දින.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| කොළඹ මහ රෝහල—සියලුම ගෙවන වාට්ටු හා අලුත් ගොඩනැගිල්ලේ නොගෙවන වාට්ටු | 100 ... | 400 ... | 4 ... | 10,000 | ...1969.4.18 වැනි දින පෙරවරු 10.00 ට |

3–393—69.3.14 දින අංක 14,845 දරණ ගැසට් පත්‍රය

## සුරාබදු දෙපාර්තමේන්තුව

### හල්මිල්ල ප්‍රවාහන පීප්ප 250 සැපයීම

ප්‍රවාහන පීප්ප 250ක් සාදා සිදුව රජයේ ස්කාගාරයට ගෙනැවිත් භාරදීම සඳහා, සුරාබදු දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අප්‍රේල් මස 5 දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1969 අප්‍රේල් 5 වැනි දින පෙ. ව. 10.30ට සුරාබදු කොමසාරිස් කායඝාලයේදී විවෘත කරනු ඇත.

3. ටෙන්ඩර් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර 1969 අප්‍රේල් මස 3 වැනි දින පස්වරු 3 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100ක් කොළඹ 7, සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

5. සෑම ටෙන්ඩරයක්ම පිටපත් 2කින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "ප්‍රවාහන පීප්ප සැපයීමේ ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

6. ලියාපදිංචි කළ තැපැල් මගින්ද ටෙන්ඩර් පත්‍ර එවිය හැක. කිසියම් ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින්, සුරාබදු කොමසාරිස් කායඝාලයේ වැ. බ. සහකාර සුරාබදු කොමසාරිස් වී. ෂන්මුගසුන්දරම් මහතා වෙත භාර දිය හැක. එබඳු අවස්ථාවලදී ඉහත 5 වන ඡේදයේ සඳහන් විස්තර ද ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය සෑම විටම මුද්‍රා තැබිය යුතුය.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1969.3.6.

3–562–69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### ඇලුමිනියම් බෝතල් මූඩි ග්‍රෝස් 275000ක් සැපයීම

ඇලුමිනියම් බෝතල් මූඩි ග්‍රෝස් 275000ක් සැපයීම සඳහා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූනි මස 16 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1969 ජූනි 16 වැනි දින පෙ. ව. 10ට කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේදී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර 1969 ජූනි මස 15 වැනි දින දවල් 12 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250ක් කොළඹ 7, සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

5. සෑම ටෙන්ඩරයක්ම පිටපත් 2කින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "බෝතල් මූඩි සැපයීමේ ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

6. ලියාපදිංචි කළ තැපැල් මගින්ද ටෙන්ඩර් පත්‍ර එවිය හැක. කිසියම් ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින්, ස්වදේශ අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදිය හැක. එබඳු අවස්ථාවලදී ඉහත 5 වන ඡේදයේ සඳහන් විස්තරද, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරය, සෑම විටම මුද්‍රා තැබිය යුතුය.

7. වැඩි විස්තර සුරාබදු කොමසාරිස් වෙතින් ලබාගත හැක.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1969.3.6.

3–563–69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## කළුතර කච්චේරිය

### හැඩිගල්ල-බොල්ලුන්න පාරේ 1 වැනි සැතපුම ගල් හා තාර දැමීම

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් විසි දහසකට (රු. 20,000) හෝ ඊට වැඩි නැතීම් වැඩ වෙනුවෙන් රජයේ වැඩ, අධ්‍යාපන හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති (රු. 20,000 සහ ඊට වැඩි වටිනාකම ඇති වැඩ සඳහා ඉහත සඳහන් දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති) වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

2. සියළුම ටෙන්ඩර් පත්‍ර එක් එක් වැඩය වෙනුවෙන් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට වෙන වෙනම කවරවල බහා සීල් තබා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය.

3. ටෙන්ඩර්, ගාළුමුවදොර, මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. නොඑසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ, වම් කෙළවරෙහි ඒ ඒ වැඩයේ නම ලියා 1969.3.28 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ටද එම වේලාවේදී පැමිණ සිටිය හැකිය.

5. 1969. 3. 24 වැනි දින දවල් 12 දක්වා කළුතර දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය. නියමිත පෝරමයේ ඉදිරිපත් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කපාගැනීම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර එක් එක් වැඩය වෙනුවෙන් රු. 20 බැගින් කළුතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් හෝ ඒ දැන්වීම ටෙන්ඩර්කරුට ලැබුණාක් මෙන් සළකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනෙක් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරා ගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

11. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩකර ගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම රජය කෙරෙහි පවත්නේ ය.

13. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම්කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි හැඟියන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දක්වූ විට කොන්ත්‍රාත්කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

14. කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද, මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වයට අනුව එවකට සහ ඉන්පසු මෙහි නිලයෙහි අත්සන් කරන අයද අයත් වේ.

15. මෙයට පෙර භාර ගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල්වේලා ඇතිව ඔවුන් දැනට කරගෙන යන වැඩ වල තත්ත්වය දක්වෙන, එම වැඩ භාරව සිටින පරිපාලන නිලධාරීන් ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල් තැන්පත් කොට ගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේදී ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරා ගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමේ සමත් විය යුතුය.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවකට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත්කරුවෙක් වෙතොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුලත් කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969. 3. 1 වැනි දින,
කළුතර කච්චේරියේ දීය.

3–386–69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

ජාතික පොලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්මේන්තුවට අයත් මහජන වෙළඳ හලට, කෝපි කුඩු ඇඟිරීම සඳහා එක් පාටකින් මුද්‍රණය කරන ලද පහත සඳහන් ප්‍රමාණයේ පොලිතින් බෑග් සැපයීම සඳහා මිළ ගණන්, කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 මාර්තු මස 28 වෙනි සිකුරාද අ.භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| ගේජ් 250 × 6 × 4″ | — | රාත්තල් ¼ බෑග්ස් 1,00,000 යි |
| ගේජ් 250 × 6 × 7″ | — | රාත්තල් ½ බෑග්ස් 50,000 යි |

වෙනත් අදල තොරතුරු කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ජ. ඩබ්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969.3.7 දින,
කොළඹ 1.
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

3–582–69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1968-69 මුදල් වර්ෂයේ දෙවැනි භාගය සඳහා අනුරාධපුර ව්‍යාපාරයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම

අනුරාධපුර ව්‍යාපාරයේ අනුරාධපුර, කුරුණෑගල, පදවිය සහ පුත්තලම දිස්ත්‍රික්කවලට අයත් පහත සඳහන් කායඝාංශ සඳහා ප්‍රාදේශීය ගෙඩනැගිලි උපකරන සැපයීමට ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 මාර්තු මස 24 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කායඝාංශ**

අනුරාධපුර නවනගර අංශය, මහකනදරාව සහ රාජාංගන දකුණු ඉවුර ගොඩනැගිලි අංශ.

**කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කායඝාංශ**

රාජාංගන වම් ඉවුර ගොඩනැගිලි අංශයන්

**පදවිය දිස්ත්‍රික්කයට අයත් කායඝාංශ**

පදවිය නවනගර අංශය

**පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කායඝාංශ**

වනාතවිල්ලුව සහ පහරිය ගොඩනැගිලි අංශ

**ප්‍රාදේශීය ද්‍රව්‍ය**

1. ඉරු දෙකේ පොල් අතු (දිග අඩි 7 ක් හා පළල අගල් 18 කට නොඅඩු 1,000)
2. දිය ගසන ලද හුණු බුසලක් සඳහා (රාත්තල් 44 කට නොඅඩු බරක් ඇති)
3. නම්බාපු හුණු බුසලක් සඳහා
4. කළුගල් 6″×9″ කියුබ් වලින්
5. කැටගල් කියුබ් වලින් (2″ 1½″, 1″, ¾″ සහ ½″)
6. පිලිස්සූ ගඩොල් (8¾″×4 ½″×2¾″ යන ප්‍රමාණයේ 1,000 බැගින්)
7. ගංගා වැලි කියුබ් වලින්

සැපයීම සඳහා මිළ ගණන් වෙන් වෙන්ව දැක්විය යුතුයි.)

(අ) වත්තේදී/පෝරනුවේදී/ගල්වලේදී (සැතපුම් 5 ක් ඇතුලත ලොරි යාහැකි ස්ථානයක් විය යුතුයි.)

(ආ) කායඝීස්ථානයට සැපයීමට.

මුදලින් රු. 50 ක් ඒ ඒ දිස්ත්‍රික්කයන් සඳහා මෙම කායඝාලයේ තැන්පත් කිරීමෙන් හෝ කච්චේරියේ තැන්පත්කොට ලබ.ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් පෝර්ම මෙම කායඝාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1969 මාර්තු මස 24 වැනි දින පෙරවරු 10.30 දක්වා පමණි.

මෙම කායඝාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් පෝර්මවල ඉල්ලුම් කළ යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1969 මාර්තු මස 24 වැනි දින දවල් 12 ට පෙර මෙම කායඝාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ "ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර බහා එවනු ලබන කවරයේ වම් පස උඩ කෙලවරේ "..................................ව්‍යාපාරයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

1969 මාර්තු මස 24 වැනි දින සවස 2.30 ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉඩම් සංවර්ධන කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් සතියක් ඇතුළත අනුරාධපුරයේ ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇනවුම් වලට අනුව දන්වන දිනයේ සිට සති දෙකක් ඇතුලත උපකරණ සැපයීමට හැකිවිය යුතුයි. මෙම කාලය ඇතුළත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ ද්‍රව්‍ය සැපයීමට අපොහොසත්වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්දේසි කඩකළ ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට සුදුසුවන අතර තැන්පත් මුදල්ද රජය සතු කිරීමට ඉඩ තිබේ.

තවද, වැඩිපුර විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැක.

එන්. බී. එප්. හරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධපුරය.

1969 පෙබරවාරි මස 26 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කායඝාලයේදීය.

3–301—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

යොමුව: පි එස් ඩී 2/2/69

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ක්ලෝර්ඩියසිපොක්සයිඩ් යනාදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ක්ලෝර්ඩියසිපොක්සයිඩ් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,843 දරණ 1969 පෙබරවාරි මස 28 වැනි දිනැති " රජයේ ගැසට් පත්‍රයේ " පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඕස්ට්‍රියාව, පෝලන්තය, සෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බුල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ.පෙ. 584 සෙලින්කෝ මන්දිරයේ පස්වන මහලේ අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 මැයි 13 වන දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණ ගතකොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) i වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1969 මාර්තු 6 වන දා.

SCHEDULE REFERRED TO

| Item No. | Description | Estimated requirements | Packing required |
|---|---|---|---|
| 1 .. | Chlordiazepoxide each tablet containing 10 mgm | 1,125,000 Tablets | In bottles of 100 tablets |
| 2 .. | Cloxacillin each capsule containing 250 mgm | 150,000 Capsules | In bottles of 100 capsules |
| 3 .. | Amphicillin each capsule containing 250 mgm | 300,000 Capsules | do. |
| 4 .. | Injection of Amphicillin 1.5cc each ampoule containing 250 mgm | 30,000 Ampoules | In boxes of 10 ampoules |

3.–588—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : එල්. එම්. 1505.

## ටෙන්ඩර් දැන්වීම සංශෝධනය

### මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

1969.2.24 වෙනි දින අංක 14,838 දරණ ගැසට් පත්‍රයේ පළ වූ පිරිදි ගෝමරේ ජලනල ව්‍යාපාරය සඳහා වූ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමේ ටෙන්ඩර් පත් භාරගනු ලබන අවසාන දිනය 1969 පෙබරවාරි මස 27 වැනි දින ප. ව. 2.30 ට වුවද ටෙන්ඩර් පත් භාර ගනු ලබන දිනය 1969 මාර්තු මස 28 වැනි දින පස්වරු 2.30 තෙක් දීර්ඝ කර ඇති බව සියළු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් දන්වා සිටිමි.

මේ අනුව ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේ 1969 මාර්තු මස 28 වෙනි දින පස්වරු 2.30 ට ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ දී බවද දන්වා සිටිමි.

ඇම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1969 පෙබරවාරි මස 28 වෙනි දින,
මහනුවර කච්චේරියේදීය.

3–320—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ මහ රෝහලේ එක්ස් කිරණ දෙපාර්තමේන්තුවට කළුවර කාමරයක් තැනීම සඳහා වූ ටෙන්ඩර්පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ගොඩනැගිලි අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු 29 වැනි සෙනසුරාදා පෙරවරු 10.30 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොළඹ ගොඩනැගිලි විධායක ඉංජිනේරු වරයා ගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 27,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදලවන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 මාර්තු 20 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත්කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළහැක.

පී. නඩරාජා,
අධිකාරී ඉංජිනේරු, ගොඩනැගිලි.

කොළඹ 7,
ගොඩනැගිලි අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
1969 පෙබරවාරි 28.

3–302—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1969 වර්ෂය තුල ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ " බී " කොටසට අයත් රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම් සහ සුළු වැඩි දියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුරයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උතුරු මැද කොට්ඨාශයේ, අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 10 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ත්‍රිකුණාමලයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රුපියල් 50 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 මාර්තු මස 28 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරි ඉංජිනේරු,
උතුරු මැද කොට්ඨාශය.

අධිකාරී ඉංජිනේරු කායඊාලය,
අනුරාධපුර, 1969.3.1.

3–382—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1969 වර්ෂය තුළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ "ඒ" කොටසට අයත් රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම් සහ සුළු වැඩි දියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුරයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උතුරු මැද කොට්ඨාශයේ, අධිකාරි ඉංජිනේරු කායඊාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 10 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ත්‍රිකුණාමලයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායඊාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 56,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 මාර්තු මස 28 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරි ඉංජිනේරු,
උතුරු මැද කොට්ඨාශය.

අධිකාරී ඉංජිනේරු කායඊාලය,
අනුරාධපුර, 1969.3.1.

3–383—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පල්ලෙගල ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරීගේ කාර්යාලය සහ නිවාස ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 10 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. මරදන්කඩවල රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායඊාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 81,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 මාර්තු මස 28 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

එම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරි ඉංජිනේරු,
උතුරු මැද කොට්ඨාශය.

අධිකාරී ඉංජිනේරු කායඊාලය,
අනුරාධපුර, 1969.3.1.

3–384—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කුලියාපිටිය රජයේ රෝහලේ නව ශල්‍යාගාරය තැනීම සඳහා වූ ටෙන්ඩර්පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 අප්‍රේල් මස 19 වැනි සෙනසුරාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කුලියාපිටියේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කායඊාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,58,000කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර්පත් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 මාර්තු මස 28 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඊාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1.
1969.3.7.

3–587—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ගැල්වනයිස් වානේ පීලි තහඩු සැපයීම

| සැපයීම වර්ගය හෝ සේවය | ලද ටෙන්ඩර් ගණන | ප්‍රමාණය හා මිනුම් ප්‍රමාණය | පිළිගත්ටෙන්ඩර්කරු | පිළිගත් මිළ |
|---|---|---|---|---|
| ගැල්වනයිස් වානේ පීලි තහඩු අඟල් 3 නේ පිලි 8 ක් ඇති 59 යේ බී.ඇස්.ඇස්. 3083ට අනුකූලව | මුල් ටෙන්ඩර් 23යි | 1. 4,000ක් 6′×26″×24 ජී | සාන්ත ඇන්තනිස් හාඩ්වෙයාර් ස්ටෝර්ස් | කොළඹදී භාරදිය හැකි මිළ හා පැටවුම් ගාස්තු ඇතුළුව හොණ්ඩරය—ප.3, සි.16, පැ.11 බැගින් |
| | | 2. 2,000ක් 7′×26″×24 ජී | | එම ප.3,සි.15,පැ.5 බැගින් |
| | | 3. 10,000ක් 8′×26″×24 ජී | | එම එම |
| | | 4. 2,000ක් 7′×26″×22 ජී | | |
| | | 5. 2,000ක් 8′×26″×22 ජී | | |

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 මාර්තු මස 14 දින,
කොළඹදී ය.

3–377/1—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ඝන පිදුරු කඩදසි බෝඩ් සැපයීම

| සැපයීම් විස්තර | ටෙන්ඩර්කරුවන් ගණන | උපලේඛන අංකය | ද්‍රව්‍ය අංකය | විස්තර | පිළිගත් මිළ ගණන් |
|---|---|---|---|---|---|
| සඝන පිදුරු කඩදසි බෝඩ් සැපයීම ... | — ... | — ... | 1 ... | සඝන පිදුරු කඩදසි රු. 1... | මිළදීගැනීමක් නොකරන ලදී. ලැබී ඇති ටෙන්ඩර් සියල්ල ප්‍රතික්ෂෙප කරනලදී. |
| | | | 2 | එම රු. 1½ | |
| | | | 3 | එම රු. 2 | |
| | | | 4 | එම රු. 2½ | |
| | | | 5 | එම රු. 3 | |

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 මාර්තු 14 දින,
කොළඹදී ය.

3–377/2—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය—බටහිර දිසාව

කොස්, මිල්ල, කැකුණ, හැඩවක, මලබොඩ, ඇටඹ, ආරිද්ද, නැටව්, තිනිය, හොර යනාදී වර්ගයන්ට අයත් ඝන අඩි 859.6 යුත් කඳන් තොග 10ක්, මුල්ල කම්බි කණු තොග 5ක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 1969.3.29 දින පෙරවරු 10 ට ගෝවින්න අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව දෙල්මැල්ල මාර්ගාසන්න දැව ගබඩාවල ඇත. තවද, මින් සමහරක් වන අපරාධවලට අයත් දැව වේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය ප්‍රථමයෙන් ඒ ඒ ස්ථානවල ඇති දැව පරීක්ෂාකර බලා සෑහීමකට පත් වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර රත්නපුර දිසා වන නිලධාරිගෙන් හෝ ගෝවින්න අඩවි වන නිලධාරියාගෙන් ලබාගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දිසා වන නිලධාරි,
බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර. 69.2.28.

3–584—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසිය—බටහිර දිසාව

ඇටඹ, කැකුණ, ආරිද්ද, හැඩවක, මිල්ල, අළුබෝ. මලබොඩ, හොර, නැටව්, දෙල්, කිරිහැඹිලිය, දවට, කොකුම්, දුන් සහ හුලංඉද්ද යනාදී වර්ගයන්ට අයත් ඝන අඩි 9,260 කින් යුත් කඳන් 10 ක්, තොග 2 කින් යුත් දුන් සහ හොර සිල්පර 5 ක් සහ තොග 2 කින් යුත් හොර සහ දුන් පිටපලු 500 ක්, රත්නපුර දිසා වන නිලධාරි විසින් 69.3.19 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව නිතියවල, කලුගල, කොඩිකන්ද සහ ගලහිටිය සමහරක් වන අපරාධවලට අයත් දැව වේ.

දැව ගැනීමට බලාපොරොත්තු වන අයහට වෙන්දේසියට ප්‍රථම එම දැව බලා සෑහීමකට පත්විය හැක. දැව පිළිබඳ සහ වෙන්දේසිය පිළිබඳ වැඩි විස්තර බස්නාහිර දිසා වන නිලධාරිගෙන් හෝ අගලවත්ත අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දිසා වන නිලධාරි,
බටහිර දිසාව.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර. 69.3.1.

3–585—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ

පහත දැක්වෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ, 1969 මාර්තු මස 21 වෙනි සිකුරාදා පෙ. ව. 10 ට කොළඹ 3, ගාළු මුවදෙර, ධීවර දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විදුලි කේතලයක්, පුටු, එලාම් ඔරලෝසු, ඉස්කිරිමක්, පිල්ටරයක් (ගැලුම් 2), ජීප් ටයර් සහ ටියුබ්, මුදල් දමන පෙට්ටි, විදුලි පන්දම්, ජනෙල් වැස්මයන්, කැරම් බෝඩ්, පන්චර් එකක්, එකතු කිරීමේ යන්ත්‍රයක්, ජලය රැස්කරන ගැල්වනයිස් ටැංකි (ගැලුම් 400 ප්‍රමාණයේ), එරේටර් ප්‍රොක්ටර්, පඩි පෙට්ටියක් සහ අකුලන පුටු වක්.

කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේ ගබඩා භාරකරු සමග කලින් දිනයක් හා වේලාවක් නියම කරගෙන රාජකාරි වේලාවන් තුළදී, වෙන්දේසියට පෙර මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් විසින් වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින්ම ගෙවීම කර මිළදී ගත් දෑ ඉවත් කර ගත යුතුය.

ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3.

3–461—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඊ 2, විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 මාර්තු මස 21 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 මාර්තු මස 19 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගත් නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය ඒ ඩී/විකිණීම්/93.
1969 මාර්තු මස 6 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

| | | | |
|---|---|---|---|
| 1. | වාර්නිස් | පෙට්ටි | 57 යි |
| 2. | විදුලි යන්ත්‍රෝපකරණ | පෙට්ටි | 16 යි |
| 3. | විදුලිය උපකරණ | පෙට්ටි | 3 යි |
| 4. | අච්චු ද්‍රව්‍ය | පෙට්ටි | 1 යි |
| 5. | විදුලිය උපකරණ | පෙට්ටි | 2 යි |
| 6. | ටසෝ රෙදි | මිටි | 6 යි |
| 7. | නූල් පන්දු | කාටූන් | 2 යි |
| 8. | කාර් පිසදමන ලේන්සු | පෙට්ටි | 1 යි |
| 9. | එස්. එම්. ඒ. පිටිකිරි | කාටූන් | 1 යි |
| 10. | සුදු මී—ඉටි | පෙට්ටි | 1 යි |
| 11. | යන්ත්‍රෝපකරණ ගැන මුද්‍රිත විස්තර | පෙට්ටි | 1 යි |
| 12. | මෝටර් වාහන අමතර කොටස් | පෙට්ටි | 1 යි |
| 13. | වතුර පයිප්ප උපකරණ | පෙට්ටි | 1 යි |
| 14. | ස්කූටර් ටයර් | | 7 යි |
| 15. | යන්ත්‍රෝපකරණ | කෑලි | 7 යි |
| 16. | කාපට් රෝල් | පෙට්ටි | 3 යි |
| 17 | යන්ත්‍රෝපකරණ | පෙට්ටි | 1 යි |
| 18. | කඹ | මිටි | 1 යි |
| 19. | විදුලිය උපකරණ | පෙට්ටි | 1 යි |
| 20. | සුවිකෝස් උපකරණ | පෙට්ටි | 1 යි |
| 21. | ටයර් | | 2 යි |
| 22. | ගැල්වනයිස් කම්බි | කොයිල් | 60 යි |
| 23. | විදුලිය උපකරණ | පෙට්ටි | 2 යි |
| 24. | විදුලිය උපකරණ | පෙට්ටි | 6 යි |
| 25. | බොයිලේරු කොටස් | පෙට්ටි | 3 යි |
| 26. | මෝටර් වාහන කොටස් | පෙට්ටි | 2 යි |
| 27. | යන්ත්‍රෝපකරණ | පෙට්ටි | 3 යි |
| 28. | සයිකල් රිම් | මිටි | 1 යි |
| 29. | රසායනික උපකරණ | පෙට්ටි | 1 යි |
| 30. | කඩදාසි | මිටි | 1 යි |
| 31. | ස්ප්‍රේයර්ස් | කාටූන් | 1 යි |
| 32. | නූල් | මිටි | 1 යි |
| 33. | යන්ත්‍රෝපකරණ | පෙට්ටි | 1 යි |
| 34. | මෝටර් වාහන උපකරණ | පෙට්ටි | 1 යි |
| 35. | කැඩුනු නූල් | මිටි | 20 යි |

3–598—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ හැංගර් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 මාර්තු මස 20 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ විකුණනු ලැබේ. 1969 මාර්තු මස 19 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගත් නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය ඒ ඩී/විකිණීම්/94.
1969 මාර්තු මස 7 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ඇමෝනියා බෑග 128 යි.
2. යූරියා බෑග 361 යි.
3. එන්. පී. කේ. පෝර බෑග 64 යි.

3–560—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීමයි

මොරටුවේ, වෙලෝනාවෙහි පිහිටි මගේ ගබඩාවේ තැන්පත් කර ඇති හානි වූ සහ කිලුටු වූ පහත සඳහන් රෙදිපිළි තොගය 1969 මාර්තු 15 වන දින පෙරවරු 10ට එම ගබඩාවේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මුළු තොගයම එසේ විකිණීම සඳහා ඉදිරිපත් කැරේ. පිළිගත් ඉල්ලුම්කරුට ඔහුගෙ ඉල්ලීමේ සඳහන් සම්පූර්ණ වටිනාකම වහාම මුදලින් ගෙවා ඔහුගේම වියදමින් භාණ්ඩ ගබඩාවෙන් ඉවත් කර ගෙන යන මෙන් නියම කැරෙනු ඇත. ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අයට මොරටුවේ, වෙලෝනාවේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත සහකාර අධ්‍යක්ෂවරයා සමග කලින් වැඩ පිළිවෙලක් යොදා ගෙන වෙලෝනාවේ දී මේ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය. දුර කතන අංක (මොරටුව 311)

### හානි වූ සහ කිලුටු වූ රෙදිපිළිවල ලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| 1. | සරොම් | ... | ... | ... 84,089 |
| 2. | සරොම් සහ පිජාමා කෑලි රාත්තල් | | | ... 30,601 |
| 2. | සාරි | ... | ... | ... 2,826 |
| 4. | අමු රෙදි සහ ඇතිරිලි රෙදි (ෂීටිං) යාර | | | ... 14,378 ½ |
| 5. | සුදු සහ නිල් සැටින් ඩ්‍රිල් යාර ... | | | ... 13,545 ½ |
| 6. | සුදු සහ පාට කළු වොයිල් යාර | ... | | ... 17,203 |
| 7. | සුදු සාරි රෙදි යාර | | ... | ... 3,048 ½ |
| 8. | කාකි සහ සුදු ටුවිල් යාර | ... | | ... 3,994 |
| 9. | පොලිස් කාකි ඩ්‍රිල් යාර | ... | | ... 3,047 |
| 10. | සුදු සහ පාට කළු පොප්ලින් යාර | | | ... 6,317¼ |
| 11. | සුදු සහ පාට ටසෝ යාර | ... | | ... 2,594¼ |
| 12. | පාට කෝස්මන්ට් රෙදි යාර | ... | | ... 2,189 |
| 13. | බෙඩ්ෆෝඩ් කෝඩ් යාර | ... | | ... 747¾ |
| 14. | සුදු සහ මුද්‍රිත පිජාමා යාර | ... | | ... 574¼ |
| 15. | ලා සහ තද නිල් ඩ්‍රිල් යාර | ... | | ... 190 |
| 16. | සාලු | ... | ... | ... 264 |
| 17. | සුදු වේට්ටි | ... | ... | ... 2,055 |
| 18. | සිල්ක් සාරි | | ... | ... 45 |
| 19. | සිල්ක් සාරි රෙදි යාර | | ... | ... 28 |
| 20. | ටර්කිස් තුවා | ... | ... | ... 13 |
| 21. | වේට්ටි රෙදි යාර ... | | ... | ... 899 |
| 22. | විවිධ රෙදි යාර | ... | ... | ... 826¼ |
| 23. | විවිධ රෙදි කෑලි යාර | | ... | ... 183¼ |
| 24. | විවිධ රෙදි කෑලි රාත්තල් | | ... | ... 34 |
| 25. | සිංහ කොඩි | ... | ... | ... 68 |

සී. සී. විජයදේවේන්ද්‍රම්,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
අධ්‍යක්ෂ වෙනුවට.

1969 මාර්තු මස 6 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් පෙදෙසේ පිහිටි
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුව.

3–599—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

### පැරණි පුවත් පත් විකිණීම

මෙම දෙපාර්තමේන්තුවේ තිබෙන පැරණි පුවත්පත් රාත්තල් 200ක් පමණ 1969 මාර්තු මස 20 වැනි දින පෙරවරු 10ට සෙලින්කෝ මන්දිරයේ 2 වැනි මහලේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ,

2. මිලට ගන්නවුන් විසින් එවලේම මුදල් ගෙවා භාණ්ඩ ගෙනයා යුතු ය.

ආනයන හා අපනයන පාලක.

1969 මාර්තු මස 4 වැනි දින,
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව,
69, රැජිණ වීදිය, කොළඹ 1.

3–484—69.3.14. දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එෆ් 1 ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 මාර්තු මස 19 වන දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනණු ලැබේ. 1969.3.16 වෙනි දින එම බඩු ගැනුම් කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත්, එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත්, සැලකිය යුතු ය.

එස්. ඒ. අන්තෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ සී/විකිණීම/92.
1969 මාර්තු මස 1 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

| | | | |
|---|---|---|---|
| 1. | වැල්ඩින් යකඩ කූරු පෙට්ටි | ... ... | 1 යි |
| 2. | රේයන් නූල් කාටූන් | ... ... | 1 යි |
| 3. | යන්ත්‍රෝපකරණ පෙට්ටි | ... ... | 1 යි |
| 4. | එයාර් පිල්ටර්ස් පෙට්ටි | ... ... | 1 යි |
| 5. | ඔයිල් සිල්ස් පෙට්ටි | ... ... | 1 යි |
| 6. | කාර් ටයර් | ... ... | 2 යි |
| 7. | රෝසින් පැකට් | ... ... | 20 යි |
| 8. | පොලොර්සන් ට්‍යුබ්ස් කාටූන් | ... ... | 1 යි |
| 9. | රතු පස් ගොඩක් | | |
| 10. | ස්ටාච් කුඩු ගොඩක් | | |
| 11. | පාර්ටිෂන් බෝඩ් (60) තොගයක් | | |
| 12. | රූපිය පෙල්ට් රෝල් | ... ... | 1 යි |
| 13. | නයිලෝන් නූල් කාටූන් | ... ... | 1 යි |
| 14. | බ්රේක් බැටරි පෙට්ටි | ... ... | 1 යි |
| 15. | ලාකඩ පෙට්ටි | ... ... | 1 යි |
| 16. | ටින් තහඩු (26) ක තොගයක් | | |
| 17. | පෝසිලින් සින්ක් | ... ... | 1 යි |
| 18. | හිස් බෝතල තොගයක් | | |
| 19. | මෙටල් හෝල්ඩර් පෙට්ටි | ... ... | 1 යි |
| 20. | වානෙ ඇන පෙට්ටි | ... ... | 1 යි |
| 21. | කව් ඇන්ඩ් ගේට් කිරි කාටූන් | ... ... | 1 යි |
| 22. | කේබල්ස් පෙට්ටි | ... ... | 1 යි |
| 23. | බිත්තර ස්ටෑන්ඩ්ස් (16) තොගයක් | | |
| 24. | අත් කන්නාඩි තොගයක් | | |
| 25. | ස්ලැබ්ස් පැරපින් වැක්ස් තොගයයි | | |
| 26. | බෙලෙක් ට්‍රේ තොගයයි | | |
| 27. | වැකුම් ප්ලාස්ක්ස් තොගයයි | | |
| 28. | උකු කිරි ටින් කාටූන් | ... ... | 3 යි |
| 29. | ගල් ලෑලි තොගයයි | | |
| 30. | යකඩ වළලු තොගයයි | | |
| 31. | බාබිල් වෙසිට්ස් තොගයයි | | |
| 32. | තේ පෙට්ටි තොගයයි | | |
| 33. | වයර් රෝල් තොගයයි | | |

3–475—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## වැඩ ගත නොහැකි දේවල් වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් දේවල් කොළඹ, සෙනෙට් මන්දිරයේ කැබිනට් කාර්යාලයේ දී 1969 මාර්තු මස 17 වැනි සඳුදා පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය අවසන් වූ වහාම එම දේවල් මුදල් ගෙවා ගෙන යා යුතුයි.

| ප්‍රකාශන | | රාත්තල් |
|---|---|---|
| ප්‍රවෘත්ති පත්‍ර (සිංහල හා ඉංග්‍රීසි) | ... ... ... | 100 |
| පරණ ගැසට් පත්‍ර | ... ... ... | 22 |
| නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ න්‍යාය පත්‍ර, කාර්ය සටහන් හා පාර්ලිමේන්තු විවාද | ... ... ... | 42 |
| විවිධ පත්‍ර | ... ... ... | 50 |

| | | පිටපත් |
|---|---|---|
| ෆර්ගසන් ඩිරෙක්ටරි ... | ... ... | 2 |
| පරණ මුද්‍රිත ඇස්තමේන්තු | ... ... | 72 |
| ලංකා රේගු වාර්තා ... | ... ... | 6 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරනිකා (සිංහල හා ඉංග්‍රීසි) | | 16 |
| ෆාර් ඊස්ට් රිවියු ... | ... ... | 8 |

ඒ. එස්. කොහොඹන්-වික්‍රම,
කැබිනට් මණ්ඩලයේ ලේකම්.

1969 මාර්තු මස 5 වැනි දින,
කොළඹ, කැබිනට් කාර්යාලයේ දීය.

3–477—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ පී. 3 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 මාර්තු මස 24 වැනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969.3.23 වැනි දින එම බඩු ගැනුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගිය හොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතු යි.

සී. එස්. මෙන්ඩිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය ඩීවී/69/11.
1969 මාර්තු මස 6 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

| | | | |
|---|---|---|---|
| 1. | කොහොඹ තෙල් පීප්ප | ... ... | 3 යි |
| 2. | කස්තුරි ද්‍රාවිත පෙට්ටි | ... ... | 1 යි |
| 3. | ටේප් රෙකෝඩර් | ... ... | 1 යි |
| 4. | ගම් ඇරබික් මලු | ... ... | 1 යි |
| 5. | ස්කුරුප්පු ඇණ පැකට්ටු | ... ... | 20 යි |
| 6. | මුරිච්චි මළු | ... ... | 8 යි |
| 7. | සාරි රෙදි පාර්සල් | ... ... | 1 යි |
| 8. | කෘත්‍රිම සේද සාරි පාර්සල් | ... ... | 1 යි |
| 9. | සාරි පාර්සල් | ... .. | 1 යි |

3–526—69.3.14 දින අංක 14,845 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 3. 1.69 | සිකුරාද | ... | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | | 9. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 16. 1.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 24. 1.69 | සිකුරාද | ... | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 31. 1.69 | සිකුරාද | ... | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 7. 2.69 | සිකුරාද | ... | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 14. 2.69 | සිකුරාද | ... | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 2.69 | සිකුරාද | ... | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ... | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | ... | 7. 3.69 | සිකුරාද | ... | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 14. 3.69 | සිකුරාද | ... | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 21. 3.69 | සිකුරාද | ... | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 28. 3.69 | සිකුරාද | ... | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | ... | 3. 4.69 | බ්‍රහස්පතින්ද | .. | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 11. 4.69 | සිකුරාද | ... | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | | 18. 4.69 | සිකුරාද | ... | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | | 25. 4.69 | සිකුරාද | ... | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 30. 4.69 | බදාද | ... | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | ... | 9. 5.69 | සිකුරාද | ... | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | | 15. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 22. 5.69 | බ්‍රහස්පතින්ද | ... | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 30. 5.69 | සිකුරාද | ... | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | ... | 6. 6.69 | සිකුරාද | ... | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 13. 6.69 | සිකුරාද | .. | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 20. 6.69 | සිකුරාද | ... | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | | 27. 6.69 | සිකුරාද | ... | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි